*සැ. යු.*- 2020.11.27 දින අංක 2204 දරන ගැසට් පත්‍රයේ I:II, II, III, IV(අ) කොටස් පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,209 - 2021 ජනවාරි මස 01 වැනි සිකුරාදා - 2021.01.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු ඇබෑර්තු .... ... ... | 04 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 17 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2021 ජනවාරි මස 22 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2021 ජනවාරි මස 08 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2021 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම ගැසට් පත්‍රය *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

1 B 82083 — 5,403 (2021/01)
B 1 -

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අතිකූත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

5. යුද්ධ සේවා අනුග්‍රහය

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

## විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස්  සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද  ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්ලවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාග ශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට  යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාග ශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

විභාග කොමසාරිස් ජනරාල්.

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

## තනතුරු - ඇබෑර්තු

### ශ්‍රී ලංකා ස්වේච්ඡා ගුවන් හමුදාව - ගුවන් භටයින්/ගුවන් කාන්තාවන් සඳහා පුරප්පාඩු

1. ශ්‍රී ලංකා ස්වේච්ඡා ගුවන් හමුදාවේ පහත සඳහන් වෘත්තීන්ට අදාළව ගුවන් භටයින්/ගුවන් කාන්තාවන් සඳහා පුරප්පාඩු පවතී. :-

**වෘත්තීන් සහ අවශ්‍ය අධ්‍යාපන, වෘත්තීය සුදුසුකම් :**

2. එක් එක් වෘත්තීන් සහ ඒ සඳහා අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් පහත සඳහන් වේ. :-

*අ. පරිගණක කාර්මික ශිල්පී (ජාලකරණය) - පිරිමි*

සිංහල/දෙමළ භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් අ.පො.ස. (සා/පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය.

සහ

පරිගණක ජාලකරණය පුහුණුව පිළිබඳ පාඨමාලාවක් සම්පූර්ණ කර තිබීම සහ අදළ ක්ෂේත්‍රයේ පළපුරුද්ද් ලබා තිබෙන අයවළුන්හට බඳවා ගැනීමේදී ප්‍රමුඛත්වය දෙනු ලැබේ.

*ආ. රූපලාවන්‍ය ශිල්පී/ශිල්පිණී - (කාන්තා/පිරිමි)*

සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවට සාමාන්‍ය සාමාර්ථයක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් අ.පො.ස. (සා/පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය.

සහ

වෘත්තීය හා කාර්මික පුහුණු අමාත්‍යාංශය විසින් පිළිගත් කාර්මික විද්‍යාලයක් මගින් පිරිනමන ලද ජාතික වෘත්තීය සුදුසුකම් අදියර IV( NVQ Level IV - සහතිකයක තිබීම අනිවාර්ය වන අතර අදළ ක්ෂේත්‍රය පිළිබඳව වසර 01කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබිය යුතුය.

3. *අනෙකුත් සුදුසුකම්* :

අ. ඉහත සඳහන් සුදුසුකම්වලට අමතරව ශ්‍රී ලංකා ස්වෙච්ඡා ගුවන් හමුදාවට බඳවා ගැනීම සඳහා අපේක්ෂකයින් පහත සඳහන් පොදු කොන්දේසි සපුරාලිය යුතුය :

| | | | |
|---|---|---|---|
| (1) | පුරවැසිභාවය | : | ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය; |
| (2) | වයස | : | 2021 ජනවාරි මස 15 වැනි දිනට<br>ස්වේච්ඡා පිරිමි - අවුරුදු 18ත් 28ත් අතර<br>ස්වේච්ඡා කාන්තා - අවුරුදු 18ත් 26ත් අතර |
| (3) | උස | : | අඩි 5යි අඟල් 5ට (165cm) නොඅඩු විය යුතුයි; (පිරිමි) } රූපලාවන්‍ය ශිල්පී<br>අඩි 5යි අඟල් 4ට (162.6 cm) නොඅඩු විය යුතුයි; (පිරිමි) } ශිල්පිණී වෘත්තිකයන් සඳහා<br>පරිගණක කාර්මික ශිල්පී (ජාලකරණ) වෘත්තිකයන් සඳහා පමණි<br><br>අඩි 5යි අඟල් 3ට (160cm) නොඅඩු විය යුතුයි; (කාන්තා) |
| (4) | බර | : | 17 < ශරීර ස්කන්ධ දර්ශකය > 26 (පිරිමි)<br>17 < ශරීර ස්කන්ධ දර්ශකය > 25 (කාන්තා)<br>ශරීර ස්කන්ධ දර්ශකය $= \frac{\text{බර(කි. ග්‍රෑ.)}}{\text{උස (මී)}^2}$ |
| (5) | වර්ණ දෘෂ්ටිය | : | සීපී 2 ($CP_2$) |
| (6) | දෘෂ්ටි තීක්ෂණත්වය | : | වම් ඇස 6/6 සහ දකුණු ඇස 6/6 (උපැස් හා කාච රහිත) |

(7) පපුව : අඟල් 30ට නොඅඩු විය යුතු ය. (පිරිමි)
පරිගණක කාර්මික ශිල්පී (ජාලකරණ) වෘත්තිකයන් සඳහා පමණි
අඟල් 32ට නොඅඩු විය යුතුය. (පිරිමි)

(8) සිවිල් තත්ත්වය : ස්වේච්ඡා බඳවා ගැනීම - විවාහක/අවිවාහක

4. දෙවන, ඡේදයන් හි දක්වා ඇති අධ්‍යාපන සුදුසුකම් හෝ ඒ හා සමාන සුදුසුකම් හෝ තුන්වන ඡේදයෙහි දක්වා ඇති අවශ්‍යතාවයන් සපුරා ගනු නොලබන අපේක්ෂකයින් ප්‍රතික්ෂේප කරනු ලැබේ. පළමු සම්මුඛ පරීක්ෂණයට පැමිණි විට උස, බර, පපුව හා ඇස් පරීක්ෂා කරනු ලැබේ. *ගැසට් පත්‍රයේ* සඳහන්කර ඇති පරිදි උස, බර, පපුව හා ඇස් පෙනීම නොමැති අයදුම්කරුවන් පළමු සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් කරනු නොලැබේ. එහෙත් ගුවන් හමුදාවට ප්‍රයෝජනවත් විශේෂ සුදුසුකම් ඇත්නම් ගුවන් හමුදාධිපතිතුමාගේ අනුමැතිය පරිදි ගුවන් හමුදාවට බඳවා ගැනීම පිළිබඳ සලකා බලනු ලැබේ.

5. ක්‍රීඩා ක්ෂේත්‍රයේ විශිෂ්ටතා ලබා ඇතොත් ඒ ගැන නිසි සැලකිල්ලක් දක්වනු ලැබේ.

9. සේවා කොන්දේසි :

(*අ*) අපේක්ෂකයින් මූලිකව ස්වේච්ඡා සේවාවන් සඳහා ආධුනිකයන් වශයෙන් බඳවා ගනු ලබන අතර, පරිගණක කාර්මික ශිල්පී (ජාලකරණ) වෘත්තිකයන් සඳහා මාසයක මූලික පුහුණුවීමේ පාඨමාලාවක් සහ රූපලාවන්‍ය ශිල්පී/ශිල්පිණියන් සඳහා මූලික හැඳින්වීමේ පාඨමාලාවක් හැදෑරිය යුතුවේ. මෙම පාඨමාලාව නිමවීමෙන් පසු ඔහු වෘත්තිය ගුවන්භටයෙකු ලෙස සේවයෙහි පිහිටුවනු ලැබේ.

(*ආ*) ආරක්ෂක අමාත්‍යාංශයේ උපදෙස් පරිදි ගුවන් හමුදාධිපතිතුමා විසින් තීරණය කරනු ලබන පරිදි ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක හෝ විදේශ පුහුණුවක් ලැබීම සඳහා ආධුනිකයන් සූදානමින් සිටිය යුතුය.

(*ඇ*) පුහුණුව ලබන කාල සීමාව තුළ දී හා ඉන් පසුව පුද්ගලයින් ගුවන් හමුද නීතියට යටත් විය යුතුයි.

(*ඈ*) සෑම ආධුනිකයෙකුටම සියලුම ආයිත්තම් සහිත නිළ ඇඳුම්, උපකරණ සහ වෛද්‍ය පහසුකම් සපයනු ලැබේ.

(*ඉ*) පුහුණුව ලබන කාලසීමාව තුළ ආධුනිකයින් හට නවාතැන් පහසුකම් හා ගුවන් හමුද භෝජනාගාර තුලින් ආහාර සපයනු ලැබේ.

(*ඊ*) පුහුණුවන කාලසීමාව තුළ දී යම් ආධුනිකයෙකු හට තම අපේක්ෂකත්වය සිය කැමැත්තෙන් අත්හිටුවා ගැනීමට අවශ්‍ය වුවහොත් ශ්‍රී ලංකා ජනරජය මගින් එම ආධුනිකයා වෙනුවෙන් එතෙක් දරා ඇති සියළුම වියදම් එම ආධුනිකයාගේ මව/පියා හෝ භාරකරු විසින් ශ්‍රී ලංකා ජනරජයට ආපසු ගෙවිය යුතුවේ. ඒ සඳහා අයදුම්පත්‍රයෙහි 28 වැනි ඡේදයේ සඳහන් ප්‍රකාශය අත්සන් කොට අයදුම්පත සමග ඉදිරිපත් කළ යුතුයි.

(*උ*) පුහුණුව ලබන කාලසීමාව තුළ ඕනෑම අවස්ථාවක දී යම්කිසි ආධුනිකයෙකුගේ නොමනා හැසිරීම මත හෝ ඔහු විසින් වගකිව යුතු කිසියම් හේතුවක් මත ගුවන් හමුද සේවයෙන් මුදාහැරීමට වගකිව යුත්තන් විසින් තීරණය කරන ලද්දේ නම් එම අවස්ථාවේදීම අදළ ආධුනිකයාගේ මව/පියා හෝ භාරකරු විසින් එතෙක් ඔහු වෙනුවෙන් දරා ඇති සියළුම වියදම් ශ්‍රී ලංකා ගුවන් හමුදාවට ආපසු ගෙවීමට එකඟ වන බවට 28 වැනි ඡේදයේ සඳහන් ප්‍රකාශය අත්සන් තබා ශ්‍රී ලංකා ජනරජයේ නියෝජිතයා වශයෙන් ගුවන් හමුදාධිපති සමග බැඳුම්කරයකට ඇතුළත් විය යුතුය.

(*ඌ*) මව, පියා හෝ භාරකරු විසින් ඉහත සඳහන් (ඊ) හා (උ) අනුඡේදයන් සම්බන්ධයෙන් මෙහි දක්වා ඇති අයදුම්පත්‍රයෙහි 28 වැනි ඡේදයේ සඳහන් ප්‍රකාශය අත්සන් කොට අයදුම්පත සමග ඉදිරිපත් කළ යුතුයි. තෝරාගනු ලබන අපේක්ෂකයින් බඳවා ගැනීමට ප්‍රථම ඔවුන්ගේ දෙමව්පියන් හෝ භාරකරුවන් විසින් ශ්‍රී ලංකා ජනරජය සමග මේ බව තහවුරු කරන බැඳුම්කරයකට ඇතුළත් විය යුතුය.

(එ) පළමුවන ඡේදයේ සිට තුන්වන ඡේදයේ පරිදි සුදුසුකම් ඇති අපේක්ෂකයින් මූලික සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන අතර, ඉන් සමත්වන්නන් වෛද්‍ය පරීක්ෂණයට කැඳවනු ලැබේ. ආධුනිකයෙකු වශයෙන් බැඳීමට ප්‍රථම තෝරා ගනු ලබන සියළුම අපේක්ෂකයින් ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ විධිවිධාන යටතේ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ප්‍රමිතියට අනුව වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබේ. ඉහත පරීක්ෂණයන් සියල්ල සාර්ථකව සමත්වන්නන් අවසාන සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. අපේක්ෂකයින්ගෙන් එම වෘත්තීන්ට අවශ්‍ය වන්නා වූ සංඛ්‍යාවන් ඔවුන් ඉහත විභාගයන්හි දී සහ සම්මුඛ පරීක්ෂණයන්හි දී දක්වූ කුසලතා මත තෝරාගනු ලැබේ.

(ඒ) අවිවාහක ගුවන් භටයින්/ගුවන් කාන්තාවන් නිවස්නයේ සිටිය යුතුයි. ඔවුන්ට ආහාර හා උපකරණ සහිතව නවාතැන් පහසුකම් සපයනු ලැබේ. අවිවාහක ගුවන් භටයින්ගේ/ගුවන් කාන්තාවන්ගේ ආහාර දීමනා ගුවන්භට භෝජනාගාරයට ගෙවනු ලැබේ.

(ඔ) විවාහක ගුවන් භටයින්/ගුවන් කාන්තාවන් සඳහා විවාහක නිවස්නයෙහි පුරප්පාඩු මත නිවාස සැපයේ. මේ සඳහා ගෙවල් කුලිය රාජ්‍ය සේවකයින්ට අදාළ පරිදි අය කරනු ලැබේ.

(ඕ) සියළුම ගුවන් භටයින්/ගුවන් කාන්තාවන් රාජකාරී හෝ පුහුණුවීම් සඳහා ඕනෑම අවස්ථාවක දී ලෝකයේ ඕනෑම ප්‍රදේශයකට අනුයුක්ත කරනු ලැබීමට යටත් වේ.

(ක) සියළුම ගුවන් භටයින්/ගුවන් කාන්තාවන් ගුවන් හමුදා පනත සහ වරින් වර නිකුත් කරනු ලබන නියෝග මගින් පාලනය කරනු ලැබේ.

07. **බඳවා ගැනීමේ කොන්දේසි :**

*(අ) ස්වේච්ඡා ගුවන් භටයින්/ගුවන් කාන්තාවන් - පරිගණක කාර්මික ශිල්පී (ජාලකරණ) රූපලාවන්‍ය ශිල්පී/ශිල්පිණී වෘත්තිකයන්*

තෝරා ගනු ලබන අපේක්ෂකයින් ස්වේච්ඡා ගුවන් හමුදාවේ තුන්වන ශ්‍රේණියේ ගුවන් භට නිලයට ඇතුළත් කරනු ලබන අතර, ඔවුන් වසර 02ක සේවා කාලයකට යටත් විය යුතුයි. අවුරුදු 02ක සේවය අවසන් වූ පසුව ගුවන් හමුදාධිපතිතුමාගේ අනුමැතිය මත පමණක් තවදුරටත් සේවය කිරීම සඳහා නැවත බැඳීමට සුදුසු ගුවන්භටයින්ට අවස්ථාව ලබාදෙනු ඇත.

08. **රාජ්‍ය භාෂාව පිළිබඳ නියමයන් .**— තෝරාගනු ලබන අපේක්ෂකයින් 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිණිස දැනට පනවා ඇති හා මින් ඉදිරියට පනවනු ලබන නියෝග හා ව්‍යවස්ථාවන් පිළිපැදිය යුතු වේ.

09. **වැටුප් හා දීමනා :**

(අ) නව මූලික වැටුප් සංශෝධනය අනුව ගුවන් භටයින්ට අදළ මූලික වැටුප සහ දීමනා පරිමාණ පහත සඳහන් පරිදි වේ. :-

| නිලය | මූලික වැටුප | අනෙකුත් දීමනා | අඩු කිරීම් රහිතව සම්පූර්ණ වැටුප |
|---|---|---|---|
| ගුවන්භට | 29,540.00 | 12,150.00 | 41,690.00 |
| නායක ගුවන්භට | 30,440.00 | 12,150.00 | 42,590.00 |
| කෝප්‍රල් | 31,340.00 | 12,150.00 | 43,490.00 |

10. **ඉල්ලුම්කරුට/ඉල්ලුම්කාරියට උපදෙස් :**

(අ) පහත දක්වෙන ආකෘති පත්‍රය අනුව ඉල්ලුම්පත් සැකසිය යුතුයි. ඉල්ලුම්පතේ සියලුම හිස්තැන් හැකි පමණ විස්තර සහිතව හා පැහැදිලිව තම අත් අකුරෙන් සම්පූර්ණ කළ යුතුයි. ඉල්ලුම්පත් 2021 ජනවාරි මස 10 වැනි දින දහවල් 12.00ට පෙර ලැබෙන සේ ''**විධායක ආධුනිකයින් බඳවා ගැනීමේ නිළධාරි, ශ්‍රී ලංකා ගුවන් හමුද වෘත්තීය පුහුණු පාසල, කොටුගොඩ**'' යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුයි. ලියාපදිංචි තැපෑලෙන් එවනු නොලබන අයදුම්පත් බාරගනු නොලැබේ. අයදුම්පතේ ඉහල වම් කෙලවරේ ''**ශ්‍රී ලංකා ගුවන් හමුදවේ ස්වේච්ඡා ගුවන් භටයින් සඳහා ඉල්ලුම්පත**'' යනුවෙන් සඳහන් කළයුතුයි. එක් අයදුම්කරුවෙක් එක් වෘත්තියකට පමණක් ඉල්ලුම් කල යුතු අතර, වෘත්තීන් කිහිපයකට ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට හා වේලාවට පසුව කොටුගොඩ, ශ්‍රී ලංකා ගුවන් හමුද වෘත්තිය පුහුණු පාසල වෙත ලැබුනාවූද, සහ මෙම නිවේදනයේ අවශ්‍යතාවලට අනුකූල නොවන්නා වූ ඉල්ලුම්පත් බාරගනු නොලැබේ.

(ආ) රාජ්‍ය සේවයේ/සංස්ථා/මණ්ඩල/සිවිල් ආයතනයන්හි සේවයේ නිරත වූවන් ස්වකීය ඉල්ලුම්පත් ඒ ඒ දෙපාර්තමේන්තු/ සංස්ථා/මණ්ඩල/සිවිල් ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුයි. තවද, යම් හෙයකින් එම ඉල්ලුම්කරු තෝරාගනු ලැබුවහොත් ඔහු මුදවා හරිනු ලබන බවට ආයතන ප්‍රධානියාගේ සහතිකයක්ද ඒ සමග තිබිය යුතුයි.

(ඇ) සම්මුඛ පරීක්ෂණය සඳහා පැමිණෙන විට හෝ ඉල්ලා සිටින අවස්ථාවක අපේක්ෂකයා විසින් පහත සඳහන් ලියකියවිලිවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුයි :—

(1) උප්පැන්න සහතිකයේ මුල් පිටපත (අධ්‍යාපන ව්‍යවස්ථා සංග්‍රහයේ කාර්යයන් සඳහා නිකුත් කළ සහතිකය හා උප්පැන්න සහතිකයෙන් උපුටා ගත් සටහන භාරගනු නොලැබේ).

(2) ජාතික හැඳුනුම්පත සහ ඡායා පිටපත

(3) අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් ඇති බව ඔප්පු කිරීමට සහතික.

(4) පිළිගත් ආයතනයකින් ලබාගත් වෘත්තීය/කාර්මික පුහුණුව හෝ පළපුරුද්දක් ඇත්නම් ඒ පිළිබඳ සහතික.

(5) මෑතකදී ලබාගත් චරිත සහතික දෙකක්, මින් එකක් අවසන් වරට තමා ඉගෙනුම ලැබූ පාසලේ ප්‍රධානාචාර්යතුමාගෙන් විය යුතු අතර, අනෙක අවුරුදු දෙකකට වැඩි කාලයක් අයදුම්කරු ගැන දැන සිටි වගකිව යුතු පුද්ගලයකුගෙන් හෝ දැනට සේවා යෝජකයාගෙන් (දැනට සේවයේ යෙදී ඇත්නම්) විය යුතුය.

(6) ක්‍රීඩා, ශිෂ්‍යභට යනාදිය පිළිබඳ සහතික.

(7) කාඩ් බෝඩ් ෆයිල් කවරයක් සහ ෆයිල් ලේස් එකක්.

(8) ග්‍රාම නිලධාරි විසින් සහතික කරන ලද අඟල් 2 x 2 1/2 වර්ණ ඡායා රූපයක්.

(ඇ) නියම කරනු ලැබූවිට ලියකියවිලි ඉදිරිපත් නොකරන අයදුම්කරුවන්ගේ අයදුම්පත් සලකා බලනු නොලැබේ.

(ඉ) ලියකියවිලි හෝ සහතිකවල මුල් පිටපත් කිසිවක් ඉල්ලුම්පත් සමග නොඑවිය යුතුයි.

(ඊ) ඉල්ලුම්පත සමග සහතිකවල මුල් පිටපත් එවා, ඒවා නැතිවුවහොත් ගුවන් හමුදාව ඊට වගකියනු නොලැබේ.

11. සම්මුඛ පරීක්ෂණයට සුදුසුයැයි සලකනු ලබන අපේක්ෂකයින් ඔවුන්ගේම වියදමින් ගුවන් හමුදා බඳවා ගැනීමේ මණ්ඩලය ඉදිරියෙහි සම්මුඛ පරීක්ෂණයන්ට පෙනී සිටිය යුතුවේ. සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන ස්ථානය දිනය සහ වේලාව පෞද්ගලිකව දන්වනු ලැබේ.

12. සම්මුඛ පරීක්ෂණය සඳහා අයදුම්කරුවන්/අයදුම්කාරියන් කැඳවනු ලබන සෑම අවස්ථාවකදී ම ඔහුගේ ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතුයි. ජාතික හැඳුනුම්පත නොමැති අයදුම්කරුවන් විසින් වෙනත් පිළිගනු ලැබූ අනන්‍යතා සහතිකයක් ඉදිරිපත් කළ යුතුයි. එසේ වුවද ජාතික හැඳුනුම්පත නොමැති අයදුම්කරුවන්/අයදුම්කාරියන් සේවයට බඳවා ගනු නොලැබේ.

13. සම්මුඛ පරීක්ෂණයෙන් සමත් වන අපේක්ෂකයින් ගුවන් හමුදා වෛද්‍ය මණ්ඩලයක් ඉදිරියෙහි පෙනී සිටිය යුතුය. සම්මුඛ පරීක්ෂවලින් ලබාගන්නා ලකුණුවල අගය අනුව අපේක්ෂකයන් ලැයිස්තු ගත කරන අතර වෘත්තීය පුරප්පාඩු සඳහා අපේක්ෂකයන් තෝරා ගනු ලබන්නේ ලබාගත් ලකුණුවල ඉහල මට්ටමේ සිටයි.

14. අයදුම්කරුවෙක් නිර්දේශ කිරීමට කැමති ඕනෑම අයෙකු එසේ කළ යුත්තේ ඔහුට චරිත සහතිකයක් දීමෙනි. යම් අපේක්ෂකයෙක් තෝරා ගැනීමට කවරාකාරයකින් හෝ පෙළඹවීමක් කිරීම, එසේ නැතහොත් එහිලා බලපෑමට උත්සාහ කිරීම ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු වීමට හේතු වන්නේය.

15. ඉල්ලුම්පත්‍රයෙහි අසත්‍ය ප්‍රකාශයක් කර තිබී, එම අසත්‍යතාවය අපේක්ෂකයා තෝරාගැනීමට පෙර හෙළිදරව් වුවහොත් ඔහුගේ අපේක්ෂකත්වය අහිමි කිරීමට ද, තෝරා ගැනීමෙන් පසු හෙළිදරව් වුවහොත් ඔහු සේවයෙන් පහ කරනු ලැබීමට ද යටත් වේ.

16. බඳවා ගැනීම සඳහා සුදුසුකම් නොලබන අයදුම්කරුවන්ට/අයදුම්කාරියන්ට ඒ බව දන්වා එවනු නොලැබේ.

එස්. කේ. පතිරණ,
ඩබ්ලිව්ඩබ්ලිව්වී (දෙවරක්), ආර්ඩබ්ලිව්පී (දෙවරක්),
ආර්එස්පී (සිව්වරක්), වීඑස්වී, යූඑස්පී, එම්එස්සී (එම්ඕඑ) යූඑස්ඒ, එම්එස්සී
(ආරක්ෂක අධ්‍යයන), කළමනාකරණ, එම්ෆිල් (ඉන්දියා)
එම්අයිඑම් (ශ්‍රී ලංකා), එන්ඩීසී, (ඉන්දියා) පීඑස්සී, කිව්එෆ්අයි
එයාර් මාර්ෂල්,
ගුවන් හමුදාධිපති.

මූලස්ථානය,
ශ්‍රී ලංකා ගුවන් හමුදාව,
තැ. පෙ. 594,
කොළඹ 02.

**ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ . . . . . . . . . . වෘත්තීය සඳහා ගුවන්භට /ගුවන් කාන්තා අයදුම්පත**

1. පුරවැසිභාවය :—————.

   (ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ පෙළපතින් ද, ලියාපදිංචි වීමෙන් ද යන්න සඳහන් කරන්න.
   ලියාපදිංචි කිරීමෙන් නම් එම සහතික පත්‍රයේ දිනය සහ අංකය සඳහන් කරන්න.).

2. සම්පූර්ණ නම (ජාතික හැඳුනුම්පතට අනුව) :—————.

3. ජාතික හැඳුනුම්පත් අංකය :—————.

4. ස්ථිර ලිපිනය :—————.

5. තැපැල් ලිපිනය :—————.

6. උපන් දිනය :—————.
   වයස ෘ (2021 ජනවාරි මස 15 දිනට) අවුරුදු :—————. මාස :—————. දින :—————.

7. උස : සෙන්ටිමීටර් :———— අඩි :———— අඟල් :————. පපුව (පිරිමි අයදුම්කරුවන් සඳහා පමණි) ෘ. . . . . .

8. ස්ථිර ලිපිනයට අයත් පොලිස් ස්ථානය :—————.

9. දිස්ත්‍රික්කය :—————.

10. ඡන්ද කොට්ඨාසය :—————.

11. ග්‍රාම නිලධාරි කොට්ඨාසය :—————.

12. දුරකථන අංකය :—————.

13. විවාහක හෝ අවිවාහක බව :—————.

14. ස්ත්‍රී/පුරුෂ භාවය :—————.

15. අධ්‍යාපනය ලැබූ පාසල :—————.

16. පාසල් පිළිබඳ විස්තර :

| *පාසලේ නම* | *සමත් විභාගය* | *විභාගයට පෙනී සිටි වර්ෂය සහ විභාග අංකය* | *සමත් වූ විෂයයන් (ශ්‍රේණි ඇතුළුව)* |
|---|---|---|---|
| | අ.පො.ස. (සා.පෙළ) :<br>අ.පො.ස. (උ.පෙළ) :<br>වෙනත් : | | |

17. පාසැලෙන් ඉවත් වූ පසු කළ රැකියා පිළිබඳ විස්තර ඃ

| *සේවා යෝජකයාගේ නම සහ ලිපිනය* | *රැකියාවේ ස්වභාවය* | *සේවා කාලය* | |
|---|---|---|---|
| | | *සිට* | *දක්වා* |
| | | | |

18. මව්පියන් පිළිබඳ විස්තර ඃ-

| *සම්පූර්ණ නම* | *උපන් ස්ථානය* | *රැකියාව* | *දැන් ලිපිනය* |
|---|---|---|---|
| පියා ඃ<br>මව ඃ | | | |

19. තනතුර සඳහා ඇති විශේෂ සුදුසුකම් :————.

20. ක්‍රීඩා අතින් දැනට පවත්නා විශිෂ්ඨතා පිළිබඳ විස්තර ඃ (ඔබ සහභාගි වූ තරග සහ ක්‍රීඩා කණ්ඩායම්, දිනයන් හා ලැබූ විශිෂ්ඨතා දක්වන්න.) :————.

21. පාසැලේ දී හෝ බාහිර සංවිධානවල දී දක්වා ඇති වෙනත් විශිෂ්ඨතා (දිනයන් සමග විස්තර දක්වන්න) :———.

22. සන්නද්ධ සේවා හෝ ස්වේච්ඡා බල සේනාවේ හෝ ශිෂ්‍යභට බලකායේ හෝ බාලදක්ෂ ව්‍යාපාරයේ හෝ ඇති පෙර සේවය :———.

23. ශ්‍රී ලංකා ගුවන් හමුදාවට හෝ සන්නද්ධ හමුදා කිසිවකට හෝ පොලීසියට හෝ බැඳීම සඳහා ඔබ විසින් මින් පෙර ඉල්ලුම් කර තිබේ ද ? එසේ නම්, ඒ පිළිබඳ විස්තර සහ ඒ ඉල්ලීම්වලට සිදුවූයේ කුමක්දැයි සඳහන් කරන්න. :————.

24. සිවිල් හෝ යුධ අධිකරණයක දී වැරදිකරු වී හෝ ඇඟ බැඳ තිබේ ද ? එසේ නම් විස්තර සඳහන් කරන්න. :————.

25. රජයේ දෙපාර්තමේන්තුවක හෝ රාජ්‍ය අංශයෙහි/ මණ්ඩලයක/ සංස්ථාවක (මහ බැංකු, ජාතික බැංකු, විශ්වවිද්‍යාල, රජය විසින් පාලනය කරන සිවිල් ව්‍යාපාර, සමාගම් ආදිය ඇතුළුව) සේවයෙහි යෙදී සිටියේ නම් එහි සේවය අවසන් කිරීමට හේතු :————.

26. චරිත සහතික පිළිබඳ විස්තර :

| *නම* | *පදවිය* | *තැපැල් ලිපිනය* |
|---|---|---|
| | | |

27. *අයදුම්කරු විසින් අත්සන් කළ යුතු ප්‍රකාශය* :

පූර්වෝක්ත ප්‍රශ්නවලට මා විසින් දී ඇති පිළිතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව අවංකව ප්‍රකාශ කරමි. ශ්‍රී ලංකා ජනරජයේ *ගැසට්* පත්‍රයේ පළ වූ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ගුවන් භටයින් සඳහා තෝරාගනු ලබන අපේක්ෂකයින් සම්බන්ධයෙන් අනුගමනය කරන ක්‍රියා පිළිවෙල හා ඒ අයට අදාළ වන ව්‍යවස්ථා ද මම කියවා අවබෝධ කර ගතිමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

28. *ඉල්ලුම්කරුගේ මව/පියා හෝ භාරකරු විසින් අත්සන් කළ යුතු ප්‍රකාශය* :

(*අ*) ඉහත අයදුම්පතේ 27 වැනි ඡේදයේ සඳහන් ප්‍රකාශයේ අත්සන් තබා, ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ආධුනිකත්වයන් සඳහා අයදුම්කර ඇති ………………… නැමැති අපේක්ෂකයාගේ මව/පියා/භාරකරු මම වෙමි.

(*ආ*) ඉහත සඳහන් අයදුම්කරු පුහුණුවීමේ පාඨමාලාවක් සඳහා තෝරා ගනු ලැබුවහොත් පහත සඳහන් වගකීම් භාර ගනිමි.

(1) පුහුණුව ලබන කාල සීමාව තුළ දී පහත නම් සඳහන් අයදුම්කරු ආධුනිකත්වයන් සඳහා ඔහුගේ අපේක්ෂකත්වය ස්වෙච්ඡාවෙන්ම අවසන් කළහොත් එම අයදුම්කරු වෙනුවෙන් ශ්‍රී ලංකා ජනරජය විසින් එතෙක් කරන ලද සියලුම වියදම් ශ්‍රී ලංකා ජනරජයට ආපසු ගෙවීමේ වගකීම.

(2) විෂමාචාරය නිසා නැතහොත් ඔහුටම/ඇයටම පාලනය කර ගත නොහැකි හේතු නිසා ඉහත නම් සඳහන් අයදුම්කරු අදාළ නිළයෙහි පිහිටුවීමට සුදුසු නොවෙතැයි බලධාරීන් විසින් වාර්තා කරනු ලැබුවහොත් ඔහු/ඇය වෙනුවෙන් ශ්‍රී ලංකා ජනරජය විසින් දරන සියලුම වියදම් ශ්‍රී ලංකා ජනරජයට ආපසු ගෙවීමේ වගකීම.

————,
දෙමව්පිය/භාරකරුගේ අත්සන.

දිනය :————.

නම :……………………………………………….
(පැහැදිලි අකුරෙන්)

ලිපිනය :……………………………………………….
……………………………………………….

————,
පළමුවන සාක්ෂිකරුගේ අත්සන.

නම :……………………………………………….
(පැහැදිලි අකුරෙන්)

ලිපිනය :————.

————,
දෙවන සාක්ෂිකරුගේ අත්සන.

නම :……………………………………………….
(පැහැදිලි අකුරෙන්)

ලිපිනය :……………………………………………….
……………………………………………….

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

01-31

---

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### දෙමළ මාධ්‍ය උප්පැන්න, මරණ හා විවාහ/අතිරේක විවාහ රෙජිස්ට්‍රාර් තනතුරු — නුවරඑළිය දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති උප්පැන්න, මරණ හා විවාහ/අතිරේක විවාහ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

01. අයදුම්කරුවන් අදාළ උප්පැන්න, මරණ හා විවාහ/අතිරේක විවාහ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සැහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන මනා පෞරුෂයකින් යුත් අය විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකි ය.

03. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට, අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 30ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 50ට නොවැඩි විය යුතු ය. (විශ්‍රාම ගැන්වීමේ උපරිම වයස අවුරුදු 65 වේ.)

04. විවාහ රෙජිස්ට්‍රාර් ධුරයක් සඳහා අයදුම්කරන්නන් විවාහක අයවිය යුතු අතර වැන්දඹු හෝ දික්කසාද නොවිය යුතුය.

05. කොට්ඨාසයේ ජනතාවගේ භාෂා අවශ්‍යතා අනුව දෙවැනි භාෂාවකින් රාජකාරි කිරීමේ හැකියාව සමග දෙවරකට නොවැඩි වාර ගණනක දී දෙමළ භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් ඇතුළුව අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් අවම වශයෙන් සම්මාන 03ක් සහිතව විෂයයන් 06කින් සමත්ව සිටිය යුතු ය. *නැතහොත්* ඊට සමාන විභාගයකින් සමත්ව සිටිය යුතු ය.

*සැ. යු.* - අ. පො. ස. (සා. පෙළ) හෝ ඒ සමාන විභාගයකදී එක් විෂයක් කොටස් දෙකකින් සමන්විත අවස්ථාවලදී, එය එක් විෂයයක් ලෙස සැලකිය යුතු ය. එම විෂය කොටස් දෙකම සමත් නම් පමණක් විෂයය සමත් ලෙස සැලකිය යුතු ය.

06. කොට්ඨාසයේ සියලු දෙනාට හෝ වැඩි දෙනෙකුට පහසුවෙන් ළඟා විය හැකි කොට්ඨාසයේ මධ්‍යගත ස්ථානයක පිහිටි තනතුරේ ගෞරවය රැකෙන ආකාරයේ ගොඩනැගිල්ලක කාර්යාලය පිහිටුවීමට හැකියාව තිබිය යුතු ය.

07. අයදුම්පත් කැඳවනු ලබන උප්පැන්න, මරණ හා විවාහ/ අතිරේක විවාහ කොට්ඨාසයට ඇතුළත්වන ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාල හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

08. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් හා ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම් ඇතුළත් "ඇමුණුම I" අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක. අයදුම්පත් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියෙන් ද (www.rgd.gov.lk) ලබා ගත හැක.

09. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2021 පෙබරවාරි මස 01 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

කේ. ජී ධර්මතිලක,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2020 දෙසැම්බර් මස 05 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

**උපලේඛනය**

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| නුවරඑළිය | නුවරඑළිය | කොටගල කොට්ඨාසයේ උප්පැන්න මරණ හා නුවරඑළිය කොට්ඨාසයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය (දෙමළ මාධ්‍යය) | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, නුවරඑළිය. |

01-323

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

උප්පැන්න, මරණ සහ විවාහ රෙජිස්ට්‍රාර් තනතුර සඳහා අයදුම්පත් කැඳවීමේ දැන්වීම — අවලංගු කිරීම

**කළුතර දිස්ත්‍රික්කය**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2202 දරන 2020.11.13 දිනැති ගැසට් පත්‍රයේ 1 වන කොටසේ (11අ) වැනි ඡේදයේ මා විසින් පළ කරන ලද කළුතර දිස්ත්‍රික්කයේ උප්පැන්න, මරණ හා විවාහ (සාමාන්‍ය), අතිරේක විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවීමේ නිවේදනයේ පහත සඳහන් කොට්ඨාසයේ පමණක් අයදුම්පත් කැඳවීමේ අවලංගු කරමි.

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ඉල්ලුම්පත් කැඳ වූ කොට්ඨාසය හා තනතුර |
|---|---|---|
| කළුතර | දොඩන්ගොඩ | දොඩන්ගොඩ කොට්ඨාසයේ උප්පැන්න මරණ හා බටහිර පස්දුන් කෝරළය කොට්ඨාසයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය |

කේ. ජී ධර්මතිලක,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2020 දෙසැම්බර් මස 05 වැනි දින,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 234/ඒ3,

01-163

---

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

උප්පැන්න, මරණ සහ විවාහ රෙජිස්ට්‍රාර් තනතුර සඳහා අයදුම්පත් කැඳවීමේ දැන්වීම — අවලංගු කිරීම

**ගාල්ල දිස්ත්‍රික්කය**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2202 දරන 2020.11.13 දිනැති *ගැසට් පත්‍රයේ* 1 වන කොටසේ (11අ) වැනි ඡේදයේ මා විසින් පළ කරන ලද ගාල්ල දිස්ත්‍රික්කයේ උප්පැන්න, මරණ හා විවාහ (සාමාන්‍ය), අතිරේක විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවීමේ නිවේදනයේ පහත සඳහන් කොට්ඨාසයේ පමණක් අයදුම්පත් කැඳවීමේ අවලංගු කරමි.

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ඉල්ලුම්පත් කැඳ වූ කොට්ඨාසය හා තනතුර |
|---|---|---|
| ගාල්ල | දිවිතුර | ගඟබඩ පත්තුව (වැලිවිටිය දිවිතුර) අතිරේක කොට්ඨාසයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය |

කේ. ජී ධර්මතිලක,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2020 දෙසැම්බර් මස 05 වැනි දින,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 234/ඒ3,

01-164

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### උප්පැන්න, මරණ සහ විවාහ රෙජිස්ට්‍රාර් තනතුර සඳහා අයදුම්පත් කැඳවීමේ දැන්වීම — අවලංගු කිරීම

### කුරුණෑගල දිස්ත්‍රික්කය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2202 දරන 2020.11.13 දිනැති ගැසට් පත්‍රයේ 1 වන කොටසේ (11අ) වැනි ඡේදයේ මා විසින් පළ කරන ලද ගාල්ල දිස්ත්‍රික්කයේ උප්පැන්න, මරණ හා විවාහ (සාමාන්‍ය), අතිරේක විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවීමේ නිවේදනයේ පහත සඳහන් කොට්ඨාසයේ පමණක් අයදුම්පත් කැඳවීමේ අවලංගු කරමි.

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ඉල්ලුම්පත් කැඳවූ කොට්ඨාසය හා තනතුර |
|---|---|---|
| කුරුණෑගල | වාරියපොල | දේවමැද්ද කෝරළේ දකුණ කොට්ඨාසයේ උප්පැන්න මරණ හා දේවමැදි හත්පත්තුව කොට්ඨාසයේ විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය |

කේ. ජී ධර්මතිලක,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2020 දෙසැම්බර් මස 14 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

01-162

---

## අධිකරණ සේවා කොමිෂන් සභාව

පහත උපලේඛනයේ සඳහන් ප්‍රදේශවල කාති තනතුරු සඳහා බඳවාගැනීම පිණිස මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත (115 පරිච්ඡේදය) යටතේ අයදුම්පත් කැඳවීම

පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති පුද්ගලයින්හට මේ සඳහා අයදුම් කළ හැක.

අයදුම්කරු මුස්ලිම් පුරුෂයෙකු විය යුතු අතර, පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිධාරියෙකු හෝ ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය විසින් පිළිගත් ආයතනයක් විසින් ප්‍රදානය කරන ලද සහතිකයක් දරන මෞලවි කෙනෙකු හෝ අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන අල් - ආලිම් සහතිකයක් දරන්නෙකු හෝ නීතිඥයෙකු හෝ ඊට සමාන වෘත්තීමය සුදුසුකම් දරන්නෙකු හෝ විශ්‍රාමික රජයේ මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු විය යුතුය.

දැනට රාජ්‍ය සේවයේ නියුක්තයෙකුට මේ සඳහා අයදුම් කළ නොහැක.

අයදුම්කරු වයස අවුරුදු 40ට වැඩි, මනා ශාරීරික යෝග්‍යතාවයෙන් යුත්, යහපත් චරිතයක් ඇති, මුස්ලිම් විවාහ සහ දික්කසාද පිළිබඳව විශේෂිත වූ ඉස්ලාම් නීතිය ගැන හොඳාකාර දැනීමක් ඇති සහ සමාජය තුළ යහපත් පිළිගැනීමක් ඇති විවාහකයෙක් විය යුතු ය.

තෝරාගනු ලබන අපේක්ෂකයා පත්වීම් ලිපියේ නිශ්චිතව සඳහන් කරනු ලබන කාලසීමාවක් සඳහා පත්කරනු ලැබේ.

කාතිවරයෙකු තමා පත්කරනු ලබන ප්‍රදේශය තුළ ස්ථිරව පදිංචිවී සිටීම නීතිමය වශයෙන් අවශ්‍යය.

කාතිවරයාහට මසකට රුපියල් 7,500 ක දීමනාවකට අමතරව සහායක සේවාවන්, ලිපිද්‍රව්‍ය හා තැපැල් වියදම් සඳහා මසකට උපරිම රුපියල් 6,250 ක ගෙවීමක් කරනු ලැබේ.

මෙහි පහත දක්වා ඇති ආකෘති පත්‍රය අනුව සැකසූ අයදුම්පත්, ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ "ක්වාසි" යනුවෙන් සඳහන් කර 2021 ජනවාරි මස 31 වැනි දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් මා වෙත ලැබෙන සේ එවිය යුතුය. අයදුම්පත් සමග ලිපි ලේඛනාදියෙහි මුල් පිටපත් එවිය යුතු නොවේ.

ආනන්දි කනගරත්නම්,
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්,
අධිකරණ සේවා කොමිෂන් සභාව.

2020 දෙසැම්බර් මස 14 වැනි දින,
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය,
තැ. පෙ. 573,
කොළඹ 12.

*උපලේඛනය*

1. **අඩ්ඩාලචේනයි** - අම්පාර දිස්ත්‍රික්කයේ අඩ්ඩාලචේනයි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කාති තනතුර සඳහා මුස්ලිම් විවාහ හා දික්කසාද පනත (115 පරිච්ඡේදය) යටතේ අධිකරණ සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි.

2. **අනුරාධපුර** - අනුරාධපුර දිස්ත්‍රික්කයේ නුවරගම්, හුරුලුගම් සහ තලගම් ආදයම් කොට්ඨාසවල කාති තනතුර සඳහා මුස්ලිම් විවාහ හා දික්කසාද පනත (115 පරිච්ඡේදය) යටතේ අධිකරණ සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි.

3. **බේරුවල** - කළුතර දිස්ත්‍රික්කයේ බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කාති තනතුර සඳහා මුස්ලිම් විවාහ හා දික්කසාද පනත (115 පරිච්ඡේදය) යටතේ අධිකරණ සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි.

4. **හම්බන්තොට** - හම්බන්තොට දිස්ත්‍රික්කයේ හම්බන්තොට අධිකරණ කලාපයේ කාති තනතුර සඳහා මුස්ලිම් විවාහ හා දික්කසාද පනත (115 පරිච්ඡේදය) යටතේ අධිකරණ සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි.

5. **එරාවූර්** - මඩකලපුව දිස්ත්‍රික්කයේ එරාවූර්පත්තු ආදයම් කොට්ඨාසයේ කාති තනතුර සඳහා මුස්ලිම් විවාහ හා දික්කසාද පනත (115 පරිච්ඡේදය) යටතේ අධිකරණ සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි.

6. **හැටන්** - නුවර එළිය දිස්ත්‍රික්කයේ හැටන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ක්වාසි තනතුර සඳහා මුස්ලිම් විවාහ හා දික්කසාද පනත (115 පරිච්ඡේදය) යටතේ අධිකරණ සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි.

7. **කෑගල්ල** - කෑගල්ල අධිකරණ කලාපයේ කාති තනතුර සඳහා මුස්ලිම් විවාහ හා දික්කසාද පනත (115 පරිච්ඡේදය) යටතේ අධිකරණ සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි.

8. **කින්නියා** - ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ කින්නියා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ක්වාසි තනතුර සඳහා මුස්ලිම් විවාහ හා දික්කසාද පනත (115 පරිච්ඡේදය) යටතේ අධිකරණ සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි.

9. **මාතර** - මාතර අධිකරණ කලාපයේ කාති තනතුර සඳහා මුස්ලිම් විවාහ හා දික්කසාද පනත (115 පරිච්ඡේදය) යටතේ අධිකරණ සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි.

10. **මුත්තූර් (කොඩ්ඩියාර්පත්තුව)** - ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ කොඩ්ඩියාර්පත්තුව ආදයම් කොට්ඨාසයේ කාති තනතුර සඳහා මුස්ලිම් විවාහ හා දික්කසාද පනත (115 පරිච්ඡේදය) යටතේ අධිකරණ සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි.

11. **නාවලපිටිය** - මහනුවර දිස්ත්‍රික්කයේ උඩබුලත්ගම ආදයම් කොට්ඨාසය සහ නුවරඑළිය දිස්ත්‍රික්කයේ හපුගස්තලාව යන ප්‍රදේශයන් සඳහා කාති තනතුර සඳහා මුස්ලිම් විවාහ හා දික්කසාද පනත (115 පරිච්ඡේදය) යටතේ අධිකරණ සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි.

12. **නින්තවූර්** - අම්පාර දිස්ත්‍රික්කයේ නින්තවූර් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ක්වාසි තනතුර සඳහා මුස්ලිම් විවාහ හා දික්කසාද පනත (115 පරිච්ඡේදය) යටතේ අධිකරණ සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි.

13. **මීගමුව** - මීගමුව අධිකරණ කලාපයේ කාති තනතුර සඳහා මුස්ලිම් විවාහ හා දික්කසාද පනත (115 පරිච්ඡේදය) යටතේ අධිකරණ සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි.

14. **ඔට්ටමාවඩි** - මඩකලපුව දිස්ත්‍රික්කයේ බටහිර කෝරලයිපත්තු ආදයම් කොට්ඨාසයේ කාති තනතුර සඳහා මුස්ලිම් විවාහ හා දික්කසාද පනත (115 පරිච්ඡේදය) යටතේ අධිකරණ සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි.

15. **පොළොන්නරුව** - පොළොන්නරුව දිස්ත්‍රික්කයේ පොළොන්නරුව අධිකරණ කලාපයේ කාති තනතුර සඳහා මුස්ලිම් විවාහ හා දික්කසාද පනත (115 පරිච්ඡේදය) යටතේ අධිකරණ සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි.

16. **පුල්මුඩේ** - ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ නැගෙනහිර සහ බටහිර කට්ටුකුලම්පත්තු ආදයම් කොට්ඨාසයේ කාති තනතුර සඳහා මුස්ලිම් විවාහ හා දික්කසාද පනත (115 පරිච්ඡේදය) යටතේ අධිකරණ සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි.

17. **පුත්තලම සහ හලාවත** - පුත්තලම දිස්ත්‍රික්කයේ පුත්තලම සහ හලාවත අධිකරණ කලාපයේ (කල්පිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය හැර) කාති තනතුර සඳහා මුස්ලිම් විවාහ හා දික්කසාද පනත (115 පරිච්ඡේදය) යටතේ අධිකරණ සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි.

18. **රත්නපුර** - රත්නපුර අධිකරණ කලාපයේ කාති තනතුර සඳහා මුස්ලිම් විවාහ හා දික්කසාද පනත (115 පරිච්ඡේදය) යටතේ අධිකරණ සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි.

19. **අවතැන්වූවන්** - පුත්තලම දිස්ත්‍රික්කයේ වෙසෙන අවතැන්වූවන් සඳහා වූ ක්වාසි තනතුර සඳහා මුස්ලිම් විවාහ හා දික්කසාද පනත (115 පරිච්ඡේදය) යටතේ අධිකරණ සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි.

20. **තංගල්ල** - හම්බන්තොට දිස්ත්‍රික්කයේ තංගල්ල අධිකරණ කලාපයේ කාති තනතුර සඳහා මුස්ලිම් විවාහ හා දික්කසාද පනත (115 පරිච්ඡේදය) යටතේ අධිකරණ සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි.

21. **තුම්පනේ** - මහනුවර දිස්ත්‍රික්කයේ තුම්පනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කාති තනතුර සඳහා මුස්ලිම් විවාහ හා දික්කසාද පනත (115 පරිච්ඡේදය) යටතේ අධිකරණ සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි.

22. **අවිස්සාවේල්ල** - අවිස්සාවේල්ල අධිකරණ කලාපයේ කාති තනතුර සඳහා මුස්ලිම් විවාහ හා දික්කසාද පනත (115 පරිච්ඡේදය) යටතේ අධිකරණ සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි.

23. **පොතුවිල්** - අම්පාර දිස්ත්‍රික්කයේ පනාමපත්තු (පොතුවිල්) ආදයම් කොට්ඨාසයේ කාති තනතුර සඳහා මුස්ලිම් විවාහ හා දික්කසාද පනත (115 පරිච්ඡේදය) යටතේ අධිකරණ සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි.

24. **ත්‍රිකුණාමලය** - ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ත්‍රිකුණාමලය නගරය, ගුවට්ස් සහ මොරාවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කාති තනතුර සඳහා මුස්ලිම් විවාහ හා දික්කසාද පනත (115 පරිච්ඡේදය) යටතේ අධිකරණ සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි.

25. **බදුල්ල** - බදුල්ල පරිපාලන දිස්ත්‍රික්කයේ කාති තනතුර සඳහා මුස්ලිම් විවාහ හා දික්කසාද පනත (115 පරිච්ඡේදය) යටතේ අධිකරණ සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි.

***1965 අංක 01 සහ 1969 අංක 32 දරන මුස්ලිම් විවාහ හා දික්කසාද පනත්වලින් සංශෝධිත මුස්ලිම් විවාහ හා දික්කසාද පනත (115 වැනි පරිච්ඡේදය යටතේ) ක්වාසිවරයෙකු පත් කිරීමේ ඉල්ලුම් පත්‍රය***

ක්වාසි බල ප්‍රදේශය :

1. මුලකුර සමග නම :

උදා. : අබ්දුර් රහ්මාන් එම්. අයි.

2. සම්පූර්ණ නම :

උදා. මුහම්මදු ඉස්හාක් අබ්දුර් රහ්මාන්

3. ස්ථිර පදිංචිය :

4. ලිපිනය :

5. උපන් දිනය :

| ව | ව | ව | ව | මා | මා | දි | දි |
|---|---|---|---|---|---|---|---|

6. වයස :

7. ජාතිය :

8. ආගම :

9. ජා. හැ. ප. අංකය :

10. දුරකතන අංකය :

11. *අධ්‍යාපන සුදුසුකම්* :

1. ..............................................................................................................
2. ..............................................................................................................
3. ..............................................................................................................
4. ..............................................................................................................
5. ..............................................................................................................

12. *වෘත්තීය සුදුසුකම්* :

1. ..............................................................................................................
2. ..............................................................................................................
3. ..............................................................................................................
4. ..............................................................................................................
5. ..............................................................................................................

13. කියවීමට හා ලිවීමට හැකි භාෂාවන් :

14. මුස්ලිම් නීතිය පිළිබඳ දැනීමක් තිබේ ද ? : ඔව් ☐ නැත ☐

15. විවාහක ද ? : ඔව් ☐ නැත ☐

16. භාර්යාව ජීවත්ව සිටී ද? : ඔව් ☐ නැත ☐

17. ඉහත දී කරන ලද සහ දැනට කරන රක්ෂා (දිනත් සමග) :

| සිට | දක්වා | රැකියාව | ස්ථානය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

18. ඉල්ලුම්කරු සතු දේපළ වටිනාකම : රු.

19. මාසික ආදායම : රු.

20. කොපමණ ණය ගැති ද, ඇතොත් : රු.

21. පසුගිය අවුරුදු 10 තුළ ඔබ ක්‍රියාකාරීව දේශපාලන කටයුතුවල නිරතව සිටියේ ද : ඔව් ☐ නැත ☐

22. ඔබ ආදායම් බදු ගෙවන්නෙක් ද : ඔව් ☐ නැත ☐

23. ඔබට එරෙහිව අධිකරණයක අපරාධ නඩු තිබුණේ ද ? තිබේ ද ? : ඔව් ☐ නැත ☐

24. උසාවිවලින් දඬුවම් ලබා ඇතොත් ඒවායේ විස්තර :

25. පෞද්ගලික තොරතුරු විමසිය හැකි අය (ඒ අය ඔබව හොඳින් දන්නා වගකිව යුතු පුද්ගලයන් විය යුතු ය) :

| | |
|---|---|
| නම : | නම : |
| ලිපිනය : | ලිපිනය : |
| දුරකතන අංක : | දුරකතන අංක : |
| රැකියාව : | රැකියාව : |
| ඔබ දැන සිටි කාලපරිච්ඡේදය : | ඔබ දැන සිටි කාලපරිච්ඡේදය : |

මෙම අයදුම්පතෙහි මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බැව සහතික කරමි.

______________,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :____________.

*සටහන* :

සියලුම සහතිකයන් හි පිටපත් ද මෙයට අමුණන්න.

01-05

---

## විභාග, විභාග ප්‍රතිඵල ආදිය

### ජාතික උරුම, ප්‍රාසාංග කලා හා ග්‍රාමීය කලා ශිල්පි ප්‍රවර්ධන කටයුතු අමාත්‍යාංශය යටතේ ඇති පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව සඳහා ක්ෂේත්‍රගත/කාර්යාලගත - ඛණ්ඩ 2 සේවා ශ්‍රේණියේ (MN-05-2016) තනතුරු සඳහා වන බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2020/2021 හා සීමිත තරග විභාගය - 2020/2021

අංක 2, 206 - 2020 දෙසැම්බර් මස 11 වැනි සිකුරාදා දින *ගැසට් පත්‍රයේ* පළකරන ලද අංක 12-332/1 හා 12-332/2 දරන ඉහත තනතුරු සඳහාවන අයදුම්පත් කැඳවීමේ නිවේදනයන් හි අංක 07 ඉල්ලුම් කිරීමේ ක්‍රමයේ ඇ කොටසෙහි සඳහන් අයදුම්පත් යොමු කිරීමේ අවසන් දිනය 2021 ජනවාරි මස 29 වැනි සිකුරාදා දින දක්වා දීර්ඝ කරනු ලැබේ.

ඒ අනුව, විභාගය සඳහාවන සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍ර ලියාපදිංචි තැපෑලෙන් 2021 ජනවාරි මස 29 වැනි දින හෝ ඊට පෙර ලැබෙනු පිණිස විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන (ආයතනික හා විදේශ විභාග) ශාඛාව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ.පෙ. 1503, කොළඹ යන ලිපිනය වෙත එවිය යුතුය.

මහාචාර්ය අනුර මනතුංග,
පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්.

2021 ජනවාරි මස 01 වැනි දින,
පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව,
කොළඹ 07.

01-360

---

**සීමිත පදනම මත රාජ්‍ය සෞඛ්‍ය කළමනාකණ සහකාර සේවයේ අධි ශ්‍රේණියට උසස් කිරීම සඳහා වන තරග විභාගය - 2018(2020)**

2020 දෙසැම්බර් මස 11 වැනි සිකුරාදා පළ කරන ලද අංක 2,206 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* සඳහන් සීමිත පදනම මත රාජ්‍ය සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවයේ අධි ශ්‍රේණියට උසස් කිරීම සඳහාවන තරග විභාගය - 2018(2020) සම්බන්ධයෙන් වූ විභාග නිවේදනයේ 08(අ) ඡේදයේ සඳහන් අයදුම්කරුවන් විසින් සම්පූර්ණ කරන ලද අයදුම්පත ආයතන ප්‍රධානියාට බාරදිය යුතු අවසාන දිනය 2021.01.15 ලෙස සංශෝධනය කරමි.

වෛද්‍ය එස්. එච්. මුණසිංහ,
ලේකම්,
සෞඛ්‍ය අමාත්‍යාංශය.

2021 ජනවාරි මස 05 වැනි දින,
සෞඛ්‍ය අමාත්‍යාංශය,
385,
සුවසිරිපාය,
පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

01-337/1

---

**කුසලතා පදනම මත රාජ්‍ය සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවයේ අධි ශ්‍රේණියට උසස් කිරීම සඳහා වන තරග විභාගය - 2018(2020)**

2020 දෙසැම්බර් මස 11 වැනි සිකුරාදා පළ කරන ලද අංක 2,206 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* සඳහන් කුසලතා පදනම මත රාජ්‍ය සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවයේ අධි ශ්‍රේණියට උසස් කිරීම සඳහාවන තරග විභාගය - 2018(2020) සම්බන්ධයෙන් වූ විභාග නිවේදනයේ 07(අ) ඡේදයේ සඳහන් අයදුම්කරුවන් විසින් සම්පූර්ණ කරන ලද අයදුම්පත ආයතන ප්‍රධානියාට බාරදිය යුතු අවසාන දිනය 2021.01.15 ලෙස සංශෝධනය කරමි.

වෛද්‍ය එස්. එච්. මුණසිංහ,
ලේකම්,
සෞඛ්‍ය අමාත්‍යාංශය.

2021 ජනවාරි මස 05 වැනි දින,
සෞඛ්‍ය අමාත්‍යාංශය,
385,
සුවසිරිපාය,
පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

01-337/2

## ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

### කළමනාකරණ සහකාර තාක්ෂණ බණ්ඩය 3 සේවා ගණයේ III ශ්‍රේණියේ තනතුරුවලට බඳවා ගැනීමේ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය 2019(2020) සඳහා අයදුම්පත් කැඳවීම

උක්ත කාරණය හා සබැඳි අංක 2195 දරන 2020.09.25 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද අංක 9-821 දරන *ගැසට්* නිවේදනයේ හා උක්ත කාරණය හා සබැඳි අංක 2196 දරන 2020.10.02 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද අංක 10-556 දරන සංශෝධනයේ සඳහන් අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 2020.10.26 දින සිට 2021.01.22 දින තෙක් දීර්ඝ කර ඇති බව මෙයින් දන්වා සිටිමි.

බී. සනත් පූජිත,
විභාග කොමසාරිස් ජනරාල්,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව.

2020 දෙසැම්බර් මස 23 වැනි දින,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

01-63

---

## සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

### හෙද අනුස්ථාපන හා සමායෝජන පාඨමාලාව සඳහා විද්‍යාවේදී හෙද උපාධිධාරීන් බඳවා ගැනීම - 2019-2020

සෞඛ්‍ය අමාත්‍යාංශයේ හෙද අනුස්ථාපන හා සමායෝජන පාඨමාලාව සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ජාතික විශ්වවිද්‍යාලයක් හෝ ආයතනයක් මගින් විද්‍යාවේදී හෙද උපාධිය ලබා ඇති පහත සුදුසුකම් සහිත ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. අයදුම්කරුවන්ගේ උපාධිය බලපැවැත්වෙන දිනය හා GPA අගය අනුව සකස් කරගත් ප්‍රමුඛතා ලේඛනයක් පදනම් කරගෙන, පවතින පුරප්පාඩු අනුව වාර්ෂිකව පුහුණු කිරීමට අවශ්‍ය සංඛ්‍යාවෙන් 25% විද්‍යාවේදී හෙද උපාධිය මත අයදුම් කරන අයදුම්කරුවන් අතුරින් තෝරාගනු ලැබේ.

2. තනතුරට අදාළ අධ්‍යාපන සුදුසුකම් :
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් දේශීය හෝ විදේශීය විශ්වවිද්‍යාලයකින් /ආයතනයකින් විද්‍යාවේදී හෙද උපාධිය (Bsc. Nursing) සම්පූර්ණ කර තිබිය යුතු ය.

3. *කායික සුදුසුකම් හා වෙනත් සුදුසුකම් :*
   (*අ*) සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය සඳහා අන් සෑම අයුරකින්ම ශාරීරික වශයෙන් යෝග්‍ය විය යුතු ය.
   (*ආ*) තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.
   (*ඇ*) ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතු ය.
   (*ඈ*) අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.
   (*ඉ*) ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම අයදුම් කළ හැක.
   (ඊ) 2021.01.29 දිනට වයස 18 ට නොඅඩු හා අවුරුදු 35 ට නොවැඩි විය යුතු ය.
   (උ) අදාළ උපාධිය බලපැවැත්වෙන දිනය 2021.01.29 දිනට පෙර දිනයක් විය යුතු ය.

4. *අයදුම්කළ යුතු ආකාරය :*

   (*අ*) මේ සමග ඇති ආකෘති පත්‍රය අනුව අයදුම්පත සකස් කර ගත යුතුය. ඒ සඳහා A4 ප්‍රමාණයේ කඩදාසි භාවිතා කළ යුතුය. අයදුම්පතේ 1 සිට 12 දක්වා පළමු පිටුවේ ද, 13 සිට 15 දක්වා දෙවන පිටුවේ ද 16 තෙවන පිටුවේ ද වන පරිදි සකස් කළ යුතු ය.

   (*ආ*) උපාධි සහතිකයේ හා GPA අගය දැක්වෙන සහතිකයේ තමා විසින් සත්‍ය බවට සහතික කරනු ලැබූ පිටපතක් අයදුම්පතට ඇමිණිය යුතුය.

   (*ඇ*) අයදුම්කරුවන් රු. 500 මුදලක් ලංකා බැංකුවේ තැපැලබේන් ශාඛාවේ අංක 7041318 දරන සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ විභාග ගාස්තු රැස්කිරීම ගිණුමට බැර කර අදාළ ලදුපත අයදුම්පතෙහි කොටුව තුළ ඇලවිය යුතුය. එම ගාස්තු කවර හේතුවක් නිසා ආපසු නොගෙවන අතර වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමට ඉඩදෙනු නොලැබේ.

   (*ඈ*) ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරියෙකු/ අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරියකු/ රජයේ ගණකාධිකාරි සේවයේ නිලධාරියකු/ රජයේ පාසලක විදුහල්පතිවරයෙකු/සාමදාන විනිශ්චයකාරවරයකු/නීතිඥවරයකු හෝ වර්ෂයකට රු. 240,360.00 කට නොඅඩු වැටුපක්

ලබන ස්ථිර වැටුප් සහිත තනතුරක් දරන රජයේ නිලධාරියෙකු විසින් අයදුම්කරුගේ/අයදුම්කාරියගේ අත්සන සහතික කළ යුතුය.

(ඇ) නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් කවරයකට බහා එම කවරයේ ඉහළ වම් කෙළවරේ "හෙද අනුස්ථාපන හා සමායෝජන පුහුණුව සඳහා විද්‍යාවේදී හෙද උපාධිධාරීන් බඳවා ගැනීම- 2019-2020 වශයෙන් හා අදාළ උපාධිය හා අධ්‍යයන වර්ෂය ද සඳහන් කර අධ්‍යක්ෂ (පාලන) 01, සෞඛ්‍ය, අමාත්‍යාංශය, සුවසිරිපාය, අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10 ලිපිනයට 2021.01.29 දිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

*සටහන.* - ඉහත (2) හා (3) යටතේ දක්වෙන සුදුසුකම් හා අනෙකුත් සියලු සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ අවසන් දිනය වන 2021.01.29 දිනට සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

5. රජයේ හෝ අර්ධ රාජ්‍ය ආයතනවල සේවකයින්ගේ අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් එවිය යුතුය. එමෙන්ම මෙය බාහිර බඳවා ගැනීමක් බවත් අදාළ පුහුණුව සාර්ථකව සම්පූර්ණ කිරීමට හැකි හෝ නොහැකි වුවහොත් කිසිදු අයුරකින් දැනට දරන තනතුරට නැවත පැමිණිය නොහැකි බවත් සිහි තබා ගත යුතු ය.

6. මෙම පොදු චක්‍රලේඛයේ දක්වෙන නියමයන්ට අනුකූල නොවන, අසම්පූර්ණ, ආදර්ශ ආකෘති පත්‍රයට අනුකූල නොවන, මූලික සුදුසුකම් සම්පූර්ණ කර නොමැති බැංකු ලදුපත අලවා නොමැති හා 2021.01.29 දින හෝ ඊට පෙර ලියාපදිංචි කර නොමැති අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලබන අතර අයදුම්පත් ලද බව දන්වා එවනු නොලැබේ.

7. ඉහත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්/අයදුම්කාරියන් අතුරින් අයදුම්කරුවන්ගේ උපාධිය බලපැවැත්වෙන දිනය හා GPA අගය අනුව සකස් කරගත් ප්‍රමුඛතා ලේඛනයක් පදනම් කරගෙන තෝරාගත් පිරිසක් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. සෞඛ්‍ය, අමාත්‍යාංශයේ ලේකම් විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක් පවත්වන අතර, සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් හෙද ව්‍යවස්ථාවේ හා මෙම *ගැසට් නිවේදනයේ* සඳහන් සුදුසුකම් පරීක්ෂා කිරීම සහ කායික යෝග්‍යතාවය පරීක්ෂා කිරීම සිදු කරනු ලැබේ.

සටහන -

(අ) සේවා අවශ්‍යතාව අනුව පුහුණුවට බඳවා ගත යුතු සංඛ්‍යාව හා සම්මුඛ පරීක්ෂණයට කැඳවිය යුතු අයදුම්කරුවන් සංඛ්‍යාව පිළිබඳව සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් තීරණය කරනු ඇත.

(ආ) සම්මුඛ පරීක්ෂණයට පැමිණෙන සියලු දෙනාම පුහුණුවට බඳවා ගන්නා බවක් මෙහි අඩංගු වගන්ති කිසිවකින් අදහස් නොවන අතර එසේ තේරුම් ගත යුතු ද නොවේ.

(ඇ) සම්මුඛ පරීක්ෂණයෙන් පසු සුදුසු වූ, නුසුදුසු වූ තෝරා නොගන්නා අයදුම්කරුවන් පිළිබඳ තොරතුරු www.health.gov.lk වෙබ් අඩවියේ පළකරනු ලබන අතර කිසිවෙකුට පෞද්ගලිකව දැනුම් දෙනු නොලැබේ.

08. සම්මුඛ පරීක්ෂණයේ දී අයදුම්කරුවන්/අයදුම්කාරියන් විසින් පහත සඳහන් ලියවිලි ඉදිරිපත් කළ යුතු ය.

(*අ*) සම්මුඛ පරීක්ෂණට කැඳවන දිනට මාස 3ක කාලයක් ඇතුලත අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් විසින් නිකුත් කරන ලද උප්පැන්න සහතිකය

(*ආ*) උපාධි සහතිකයේ මුල් පිටපත හා GPA අගය දක්වෙන සහතිකය (තමා විසින් සත්‍ය බවට සහතික කරනු ලැබූ පිටපත් සමග ඉදිරිපත් කළ යුතුය.)

(*ඇ*) ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ රියදුරු බලපත්‍රය හා තමා විසින් සත්‍ය බවට සහතික කරනු ලැබූ පිටපත

09. පුහුණු කිරීමේ පටිපාටිය -

| *පාඨමාලාව* | *එම පාඨමාලාවේ කාලසීමාව* | *භාෂා මාධ්‍යය* |
|---|---|---|
| හෙද අනුස්ථාපන හා සමායෝජන | මාස 06 | ඉංග්‍රීසි |

(අ) තෝරාගත් අයදුම්කරුවන්/අයදුම්කාරියන් අදාළ අනුස්ථාපන හා සමායෝජන පාඨමාලාව හැදෑරීම සඳහා ඒ ඒ පුහුණු පාසල්වලට අනුයුක්ත කරනු ලැබේ. පාඨමාලාවන් ඉංග්‍රීසි භාෂාවෙන් හැදෑරිය යුතුය.

(ආ) පුහුණු පාසල්වලට ඇතුළත් කරන අභ්‍යාසලාභීන් පුහුණු පාසල්වල බලපැවැත්වෙන නීති රීතිවලට හා සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් කලින් කලට පනවනු ලබන වෙනත් නියෝගවලට ද යටත් වනු ඇත.

(ඇ) පුහුණුව ලබන කාල පරිච්ඡේදය අවසානයේ දී සාර්ථකව එය නිම නොකරන හෝ වැඩ හා හැසිරීම සතුටු දායක නොවන හෝ තමන් ඇතුළත් කරනු ලබන පුහුණු පාසලෙහි පවතින කොන්දේසි පිළිපැදීමට අපොහොසත් වන අභ්‍යාසලාභීන්ගේ පුහුණුව ඕනෑම අවස්ථාවක දී වන්දි ගෙවීමකින් තොරව අවසන් කළ හැක.

(ඉ) පුහුණුව ලබන කාල පරිච්ඡේද තුළ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි දක්වෙන විධිවිධානවලට යටත්ව සිසු හෙද/හෙදියන්ට තෙවන වසරේ දී ලබා දෙන මාසික දීමනාව ලබා දෙනු ඇත.

(ඊ) පුහුණු පාසලට ඇතුළත් කරනු ලබන අවස්ථාවේ දී පුහුණුව සාර්ථකව නිමකරන බවටත්, පුහුණු පාඨමාලාව අතහැර නොයන බවටත්, එකී පුහුණුව සම්පූර්ණයෙන්ම නිම කිරීමෙන් පසු අදාළ තනතුරේ පත්වීම් ලදහොත් අවම වශයෙන් වර්ෂ පහක් (05) කාලපරිච්ඡේදයක් අදාළ පළාත් සභාවට හෝ රේඛීය අමාත්‍යාංශයට අයත් පත්කළ රෝහලේ හෝ සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ හෝ අදාළ තනතුරේ සේවය කරන බවටත්, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් සමග ගිවිසුමකට හා ඇපකරයකට එළඹිය යුතු අතර, එම ගිවිසුම හා ඇපකරය පුහුණුවට ලියාපදිංචිය ලබන දිනයේම අධ්‍යාපන, පුහුණු හා පර්යේෂණ ශාඛාව වෙත බාරදිය යුතුය. පුහුණු කාලසීමාව තුළ දී පුහුණුවෙන් ඉවත් වුවහොත් හෝ පුහුණුව හැර ගියහොත් හෝ ඉහත (ඇ) වගන්තිය අනුව පුහුණුවෙන් ඉවත් කිරීමට සිදුවුවහොත් හෝ පත්වීම් ලැබ වර්ෂ පහක (05) කාල පරිච්ඡේදයක් අදාළ පළාත් සභාවේ හෝ රේඛීය අමාත්‍යාංශයේ පත් කළ රෝහලේ හෝ සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ හෝ අදාළ තනතුරේ සේවය කිරීමට අපොහොසත් වුවහොත් හෝ පුහුණු කාලය තුළ දී ඔහුට/ඇයට ගෙවන ලද දීමනාව, රජය විසින් දරන ලද විය හියදම් හා ඇපකරයට අදාළ මුදල ඔහු/ඇය විසින් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවට ගෙවිය යුතුය. එසේ නොමැති වුවහොත් එම මුදල් අයකර ගැනීමට ගිවිසුම් ප්‍රකාරව නීත්‍යානුකූලව කටයුතු කිරීමට පියවර ගනු ඇත.

10. සේවයේ නියුක්තකරවීමේ නියමයන් :

පුහුණුව අවසානයේ අදාළ තනතුරේ ස්ථිර පත්වීම් ප්‍රදානය කිරීමට සිදුකරන /නොකරන බව තීරණය කරනු ලබන්නේ එම අවස්ථාවේ පවතින පුරප්පාඩු ප්‍රමාණය මත පදනම්ව ය. ඒ අනුව අදාළ තනතුරේ ස්ථිර පත්වීම් ප්‍රදානය කිරීමට සෞඛ්‍ය, අමාත්‍යාංශය තීරණය කළහොත් අපේක්ෂක/අපේක්ෂිකාවන් තමන්ගේ පුහුණුවට බඳවාගත් පාඨමාලාවට අදාළ බඳවා ගැනීමේ පටිපාටියේ කොන්දේසි හා පුරප්පාඩු අනුව 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි උපලේඛනය I හි සඳහන් MT-7-2016 වැටුප් කේතයට අදාල වැටුප් පරිමාණයේ 4 වන පියවරේ තබා වැටුප් ගෙවීම මත III ශ්‍රේණියේ හෙද තනතුරට පත්කිරීමට කටයුතු කෙරේ.

11. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් පිළිබඳ විස්තර අයදුම්පත පිරවීමේදී ඉතා සැලකිලිමත්ව හා නිවැරදිව ඇතුලත් කල යුතුය. පුහුණුව සඳහා බඳවා ගැනීමෙන් හෝ පත්වීම් ලැබීමෙන් පසු යට කී සහතික ව්‍යාජ බවට ඔප්පු වුවහොත්, නීත්‍යානුකූලව කටයුතු කිරීම සඳහා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත යොමු කරන අතර, ඒ දෙනු ලබන පත්වීම් අවලංගු කිරීමෙන් පුහුණුවෙන්/තනතුරින් පහ කරනු ලැබේ. තවද ඒ සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කර නැවත රජයේ සේවයට නොගන්නවුන්ගේ අසාධු ලේඛනයට ඔහුගේ/ඇයගේ නම ඇතුළත් කිරීමට කටයුතු කරනු ලැබේ. තවද පුහුණු කාලය තුළ දී ඔහුට/ඇයට ගෙවන ලද දීමනාව, රජය විසින් දරන ලද වියහියදම් හා ඇපකරයට අදාළ මුදල ඔහුගෙන්/ඇයගෙන් අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ.

12. තෝරාගත් අයදුම්කරුවන් අදාළ පාඨමාලාව හැදෑරීමට හා දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට කායික මානසික යෝග්‍යතාවයකින් හෙබි බව සනාථ කරනු පිණිස පුහුණුවේ පළමු මාසය ඇතුළත වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර, වෛද්‍ය පරීක්ෂණයේ දී අයෝග්‍ය බව පෙනී යන අයදුම්කරුවන් පාඨමාලාවේ රැඳී සිටීමට නුසුදුස්සන් වනු ඇත.

13. මෙම පුහුණු කාල සීමාව තුළදී වෘත්තීය සමිති කටයුතුවල යෙදීමට හෝ පෞද්ගලිකව සේවයේ යෙදීමට හෝ කිසිම අයිතිවාසිකමක් නොමැත. එවන්නක් සිදු කල බව අනාවරණය වුවහොත් පුහුණුවෙන් ඉවත් කිරීමට හෝ වෙනත් සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමට කටයුතු සිදු කරනු ඇත.

14. ඉහත පරිදි බඳවා ගන්නා ලද සියලුම දෙනා රජයේ සේවකයින්ට අදාල වන සියලුම නීතිරීති, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධානවලට, සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව විසින් නියම කරනු ලබන ප්‍රතිපත්තිවලට, රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතීවලට, මුදල් රෙගුලාසිවලට, හෙද ව්‍යවස්ථාවට හා එයට වරින් වර සිදු කරනු ලබන සංශෝධන වලට හා කලින් කලට බලපවත්නා රජයේ පොදු රෙගුලාසිවලට යටත්වනු ඇත.

15. පුහුණුවට බඳවා ගනු ලබන අයදුම්කරුවන් සඳහා පුහුණු පාසල්වල නේවාසික පහසුකම් සැපයීමට මෙම අමාත්‍යාංශය බැඳී නොසිටී. එසේ ලබා දෙන්නේ නම් ඒ සඳහා තක්සේරු නිවාස හා කාමර කුලිය, ජලය හා විදුලි බිල්පත් අයකරනු ලැබේ.

16. පුහුණුවට බඳවා ගැනීම සම්බන්ධයෙන් මෙම පොදු චක්‍රලේඛය මඟින් ආවරනය වන හෝ නොවන යම් කරුණක් සම්බන්ධයෙන් යම් ගැටලු සහගත තත්ත්වයක් උදා වුවහොත් ඒ පිළිබඳව අමාත්‍යාංශයේ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වනු ඇත. මෙම පොදු චක්‍රලේඛයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල පාඨය බල පැවැත්විය යුතු වන්නේ ය.

වෛද්‍ය එස්. එච්. මුණසිංහ,
ලේකම්,
සෞඛ්‍ය අමාත්‍යාංශය.

2020 දෙසැම්බර් මස 31 වැනි දින,
සෞඛ්‍ය අමාත්‍යාංශයේ දී,

ආදර්ශ අයදුම්පත්‍රය

**හෙද අනුස්ථාපන හා සමායෝජන පාඨමාලාව සඳහා විද්‍යාවේදී**
**හෙද උපාධිධාරීන් බඳවා ගැනීම - 2019-2020**

අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර අයදුම්පත් කැඳවීමේ නිවේදනය හොඳින් කියවා බලන්න.

1. (අ) මුලකුරු සමග අගට යෙදෙන නම -
:————.(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

(ආ) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

(ඇ) සම්පූර්ණ නම සිංහලෙන් / දෙමළෙන්) :————.

2. ජාතික හැඳුනුම්පත් අංකය :————.

3. තැපැල් ලිපිනය :————.

4. ස්ථිර ලිපිනය :————.

5. දුරකථන අංකය :————.

6. (අ) පදිංචි දිස්ත්‍රික්කය :————.

(ආ) ඔබ මෙම දිස්ත්‍රික්කය තුළ ස්ථිර පදිංචි කරුවෙක් ද ? :————.

7. (අ) උපන් දිනය ඃ වර්ෂය :————. මාසය :————. දිනය :————.

(ආ) 2021.01.29 දිනට වයස ඃ අවුරුදු :————. මාස :————. දින :————.

8. ස්ත්‍රී/පුරුෂභාවය ඃ ස්ත්‍රී ☐ පුරුෂ ☐ (අදාළ කොටුවේ ✓ යොදන්න)

9. ඔබ ශ්‍රී ලාංකා පුරවැසියෙක්ද යන වග ඃ ඔව් ☐ නැත ☐ (අදාළ කොටුවේ ✓ යොදන්න)

10. විවාහක/අවිවාහක බව :- විවාහක ☐ අවිවාහක ☐ (අදාළ කොටුවේ ✓යොදන්න)

11. උස ඃ අඩි............අඟල්...............

12. අධ්‍යාපන සුදුසුකම් ඃ

| *සමත් වූ උපාධිය* | *උපාධිය වලංගු වන දිනය* | *ශ්‍රේණියේ සාමාන්‍ය අගය* ***(GPA)*** | *විශ්ව විද්‍යාලය* | *අධ්‍යයන වර්ෂය* |
|---|---|---|---|---|
| | | | | |

13. ඔබ කවදා හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු වී තිබේද ? ඔව් ☐ නැත ☐

(අදාළ කොටුවේ ✓ යොදන්න)

එසේ නම් හේතු..........................................................................

14. *අයදුම්කරුගේ සහතිකය :*

මා විසින් අයදුම්පත් කැඳවීමේ නිවේදනය හොඳින් කියවා බලා අවබෝධ කරගෙන එහි සඳහන් සියලු කොන්දේසිවලට යටත්ව, මෙම අයදුම්පත සම්පූර්ණ කළ බවත්, මම වෙනත් කිසිදු පූර්ණකාලීන පාඨමාලාවකට සහභාගි නොවන බවත් මෙම අයදුම්පතෙහි මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බවත් ගෞරවයෙන් ප්‍රකාශ කරමි.

මා විසින් කරන ලද මෙම ප්‍රකාශය හෝ අයදුම්පතෙහි සඳහන් කර ඇති කුමන හෝ තොරතුරක් අසත්‍ය යැයි ඔප්පු වුවහොත් පුහුණුවට නුසුදුස්සෙකු වන බව හා පත්වීම් ලදහොත් ඉන් අනතුරුව එසේ ඔප්පු වුවහොත් සේවයෙන් පහ කරනු ලැබීමට මා යටත් වන බව ද මම දැන සිටිමි.

එමෙන්ම මෙම බඳවා ගැනීම බාහිර බඳවා ගැනීමක් බවත්, මට අදාළ පුහුණුව සාර්ථකව සම්පූර්ණ කිරීමට හැකි හෝ නොහැකි වුවහොත් කිසිදු අයුරකින් දැනට දරන තනතුරට නැවත පැමිණිය නොහැකි බවත් හොඳින් අවබෝධ කරගෙන සිටින බවත් ප්‍රකාශ කර සිටිමි.

*රු. 500 ක් ගෙවා ලබාගත් බැංකු ලදුපත මෙහි අලවන්න.*

________,
අයදුම්කරුගේ/අයදුම්කාරියගේ
අත්සන.

දිනය :————.

15. *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :*

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ....................... මයා/මිය/මෙනවිය/මා පෞද්ගලිකව ම දන්නා හඳුනන බවද, ඔහු/ඇය ............ දින මා ඉදිරිපිට දී ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවද සහතික කරමි.

_____________,
සහතික කරන්නාගේ අත්සන හා නිළ මුද්‍රාව.

දිනය :————.

සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය :————.

16. ඉල්ලුම් කරන අපේක්ෂකයා රාජ්‍ය සේවාවේ/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයෙක් නම් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය (අදාළ නොවන වචන කපා හරින්න.)

ඉහත අයදුම්කරු/අයදුම්කාරිය වන ....................... මහතා/මහත්මිය/මෙනෙවිය, මෙම දෙපාර්තමේන්තුවේ ............ තනතුර දරන බව මින් සහතික කරමි.

ඉල්ලුම් පත්‍රයේ සඳහන් තොරතුරු සත්‍ය තොරතුරු බව සහතික කරන අතර, මොහු/මැය පුහුණුව සඳහා තෝරාගතහොත් ඔහු/ඇය නිදහස් කළ හැකි/නොහැකි බව දන්වමි.

එමෙන්ම මෙම බඳවා ගැනීම බාහිර බඳවා ගැනීමක් බවත්, ඔහු/ඇය අදළ පුහුණුව සාර්ථකව සම්පූර්ණ කිරීමෙන් හෝ නොකිරීමෙන් පසු කිසිදු අයුරකින් දැනට දරන තනතුරට නැවත පැමිණිය නොහැකි බවත්, ඔහුට/ඇයට අවබෝධ කරදුන් බවත් දන්වා සිටිමි.

_____________,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන හා නිළ මුද්‍රාව.

දිනය :————.
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නම :————.
තනතුර :————.
ලිපිනය :————.

01-208

**සෞඛ්‍ය අමාත්‍යාංශය**

**අතුරු වෛද්‍ය සේවාවේ පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනී පුහුණු පාඨමාලාව සඳහා අභ්‍යාසලාභීන් බඳවා ගැනීම - 2020**

සෞඛ්‍ය අමාත්‍යාංශයේ අතුරු වෛද්‍ය සේවාවේ පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනී පුහුණු පාඨමාලාවට අභ්‍යාසලාභිනියන් බඳවා ගැනීම සඳහා 2015 හෝ 2016 හෝ 2017 යන වර්ෂවලින් එක් වර්ෂයකදී අ.පො.ස. (උ.පෙළ) ඕනෑම විෂය ධාරාවකින් විභාගය සමත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මේ සඳහා අයදුම් කළ හැක්කේ මෙම අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවිය (www.health.gov.lk) ඔස්සේ පමණි.

සැලකිය යුතුයි ඃ අංක 2139 දරන 2019.08.30 දිනැති ගැසට් පත්‍රය අනුව ඉහත දක්වෙන වර්ෂයන්හි දී අ.පො.ස. (උ.පෙළ) විභාග ප්‍රතිඵල මත අයදුම්කර, සම්මුඛ පරීක්ෂණ වලින් තෝරාගෙන දැනටමත් පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනී පුහුණුවට ලියාපදිංචි වී ඇති සිසුවියන් මෙම ගැසට් නිවේදනය යටතේ නැවත අයදුම් කිරීම අවශ්‍ය නොවේ.

| *සේවාව* | *පුහුණු පාඨමාලාවේ නම* | *පුහුණු කාලසීමාව* | *පුහුණු පාඨමාලාව හැදෑරිය යුතු භාෂා මාධ්‍යය* |
|---|---|---|---|
| අතුරු වෛද්‍ය | පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනී | ක්ෂේත්‍ර පුහුණුව මාස 06 ඇතුළුව වසර 01 1/2 | සිංහල, දෙමළ |

**අංක 01 වගුව**

2. *තනතුරට අදාළ අධ්‍යාපන හා වෙනත් විශේෂ සුදුසුකම් :-*

| *අ.පො.ස (සා. පෙළ) සුදුසුකම්* | *අ.පො.ස (උ. පෙළ) සුදුසුකම්* | *පුහුණු පාඨමාලාවට අදාළ වෙනත් විශේෂ සුදුසුකම්* |
|---|---|---|
| සිංහල භාෂාව/දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයයකට අවම වශයෙන් සම්මාන සාමාර්ථයක් සහිතව දෙවරකට නොවැඩි වාර ගණනක දී ඉංග්‍රීසි භාෂාව ඇතුළුව විෂයයන් හයකින් (06) කින් අ.පො.ස. (සා.පෙළ) සමත්වීම. | 2015 හෝ 2016 හෝ 2017 යන වර්ෂවලින් එක් වර්ෂයකදී ඕනෑම විෂය ධාරාවකින් අ.පො.ස. (උ.පෙළ) විභාගයෙන් එක් වරකදී විෂයයන් තුනක් (03) සමත්වීම. විද්‍යා විෂය ධාරාවෙන් අ.පො.ස. (උ.පෙළ) සමත් සිසුවියන්ට ප්‍රමුඛතාවය ලබාදෙනු ලැබේ. | 1. අයදුම් කළ හැක්කේ ස්ත්‍රී පක්ෂයට පමණි.<br>2. අයදුම්කාරියන් අයදුම්පත් කැඳවන අවසන් දිනට (2021.02.01) වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 30ට නොවැඩි විය යුතුය.<br>3.උස අඩි 4 අඟල් 10ක් හෝ ඊට වැඩි විය යුතුය. (147.3 cm)<br>4. සියලුම අයදුම්කාරියන් අවිවාහක විය යුතු අතර පුහුණු කාල සීමාව තුල විවාහ නොවිය යුතුය. න්‍යායික පුහුණුව ලබාදී තාවකාලිකව සේවයේ යොදවන සිසුවියන්ද විධිමත් පුහුණුව සඳහා අනුයුක්ත කර පත්වීම් ලබා දෙන තෙක් විවාහයට ඇතුළත් නොවිය යුතුය. |

3. *පාඨමාලාවට අදාළ සුවිශේෂී කරුණු ඃ*

3.1. පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනී තනතුරට බඳවා ගැනීමේ පරිපාටියේ හා ඊට වරින්වර සිදුකරන ලද සංශෝධන ප්‍රකාරව සුදුසුකම් සපුරන අයදුම්කාරියන්ගෙන් බඳවා ගැනීම සිදු කරනු ලබන අතර, අයදුම්කාරියන්ගේ අ.පො.ස. (උ.පෙළ) Z අගය පදනම් කරගෙන පුහුණු පාඨමාලාවට බඳවා ගනු ලැබේ.

3.2 පුහුණුව සඳහා බඳවාගනු ලබන සංඛ්‍යාව තීරණය කරනු ලබන්නේ පුරෝකථනය කළ පුරප්පාඩු සංඛ්‍යාව හා පුහුණු ධාරිතාවය අනුව වේ. දිවයිනෙන් බඳවා ගැනීමට නියමිත මුළු සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්කයේ ජනගහනය පදනම් කරගෙන ජන සංඛ්‍යාවට සමානුපාතිකව බෙදා එක් එක් දිස්ත්‍රික්කයෙන් බඳවා ගත යුතු සංඛ්‍යාව තීරණය කරනු ලැබේ.

3.3 ඉන්පසු එම එක් එක් දිස්ත්‍රික්කයෙන් බඳවාගත යුතු සංඛ්‍යාව අදාළ දිස්ත්‍රික්කයෙන් එක් එක් වර්ෂයෙන් අයදුම්කර අවශ්‍ය අවම අධ්‍යාපන සුදුසුකම් සම්පූර්ණ කර ඇති මුළු අයදුම්කාරියන් සංඛ්‍යාවට සමානුපාතිකව බෙදා අදාළ දිස්ත්‍රික්කයෙන් එක් එක් වර්ෂයෙන් බඳවා ගත යුතු සංඛ්‍යාව තීරණය කරනු ලැබේ.

3.4 විද්‍යා විෂය ධාරාවෙන් අ.පො.ස. (උ.පෙළ) සමත් සිසුවියන්ට ප්‍රමුඛතාවය ලබාදීමෙන් අනතුරුව එම එක් එක් වර්ෂයෙන් බඳවාගත යුතු සංඛ්‍යාව එම වර්ෂයේ ඕනෑම විෂය ධාරාවකින් අයදුම්කර අවම සුදුසුකම් සම්පූර්ණ කල අයදුම්කාරියන් සංඛ්‍යාවට සමානුපාතිකව බෙද අදළ දිස්ත්‍රික්කයෙන් එක් එක් වර්ෂයෙන් එක් එක් විෂයධාරාවෙන් ඉහළම Z අගය ලබා ගන්නා අයදුම්කාරියන් අතරින් දිස්ත්‍රික් පදනමින් තෝරාගනු ලැබේ.

3.5 යම් දිස්ත්‍රික්කයකට ඉහත සඳහන් පරිදි වෙන් කල පුරප්පාඩු සංඛ්‍යාව එම දිස්ත්‍රික්කය සඳහා සුදුසුකම් සපුරා ඇති අයදුම්කාරියන්ගෙන් සම්පූර්ණ කල නොහැකි අවස්ථාවලදී එම පුරප්පාඩු සංඛ්‍යාව දිවයිනේ සියලු දිස්ත්‍රික් අතර එම දිස්ත්‍රික්කවල ජන සංඛ්‍යාවට සමානුපාතිකව නැවත බෙදහරිනු ලැබේ.

04. *පොදු කරුණු* :

4.1 ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතු ය.;
4.2 සෑම අයදුම්කාරියෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය ලබාදීම සඳහා බැඳී සිටිය යුතුය.
4.3 මනා ශාරීරික සහ මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.
4.4 අයදුම්කාරියන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.
4.5 පුහුණුවෙන් පසු මධ්‍යම රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර පත්වීමක් ලද හොත් අවම වශයෙන් වසර 10 ක් වත් සේවය කිරීමට කැමති විය යුතුය.
4.6 තමන් අයදුම්කරන දිස්ත්‍රික්කය තුළ අයදුම්පත් භාරගන්නා අවසන් දිනය වන 2021.02.01 වැනි දිනට පූර්වාසන්න වසර 03ක් අඛණ්ඩව පදිංචිව සිටිය යුතු ය. පදිංචිය සනාථ කිරීම සඳහා ග්‍රාම නිලධාරි සහතිකය ඉදිරිපත් කළ යුතු ය.

*සටහන* :-
යම් අයදුම්කාරියකගේ පියා හෝ මව රජයේ, පළාත් රාජ්‍ය සේවයේ හෝ රාජ්‍ය සංස්ථාවක මාරු කළ හැකි සේවයක යෙදී සිටීම හේතුවෙන් හෝ වෙනත් නොවැළැක්විය හැකි කරුණක් මත යම් අයදුම්කාරියකට පූර්වාසන්න වසර 03 තුළ පදිංචිය සනාථ කළ නොහැකි අවස්ථාවල දී පිළිගත හැකි හේතු ඉදිරිපත් කළහොත් ඒ පිළිබඳව අවසන් තීරණය සෞඛ්‍ය, අමාත්‍යාංශයේ ලේකම් විසින් ගනු ලැබේ.

05. *වෙනත් කරුණු* :

5.1 මෙම පාඨමාලාව පූර්ණකාලීන පාඨමාලාවක් වේ. එබැවින්, සතියේ දින පහේ සහ සෙනසුරාදා පෙරවරුවේ විශ්වවිද්‍යාලයක හෝ වෙනත් රජයේ ආයතනයක හෝ සෞඛ්‍ය වෛද්‍ය අමාත්‍යාංශය යටතේ හෝ වෙනත් කුමන හෝ පූර්ණකාලීන පාඨමාලාවන් හදාරන සිසුවියන් මේ සඳහා අයදුම් නොකළ යුතු ය. විශ්වවිද්‍යාලයක හෝ වෙනත් රජයේ ආයතනයක හෝ පූර්ණකාලීන පාඨමාලාවක් හදාරන අයකු එසේ අයදුම් කිරීමට අදහස් කරන්නේ නම්, ඒ සඳහා පහත (5.2) දැක්වෙන ආකාරයට ක්‍රියාකළ යුතු ය. සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය යටතේ පූර්ණකාලීන පුහුණු පාඨමාලාවක ලියාපදිංචි වී සිටින අයෙකු මේ සඳහා අයදුම්කිරීමට අදහස් කරන්නේ නම් පහත (5.3) දැක්වෙන ආකාරයට ක්‍රියාකල යුතුය. යමෙකු එලෙස (5.2) සහ (5.3) වගන්තිවලට අනුව කටයුතු නොකර මේ සඳහා අයදුම් කර, පසු අවස්ථාවකදී එය අනාවරණය වුවහොත් අදල පාඨමාලාවෙන්/තනතුරෙන් ඉවත් කර ඒ වනතෙක් රජය විසින් ඇය වෙනුවෙන් දරා ඇති සියලුම වියදම් අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ.

5.2 කිසියම් දිනක ඔබ විශ්වවිද්‍යාලයක හෝ වෙනත් රජයේ ආයතනයක පූර්ණකාලීන පාඨමාලාවක් සඳහා ලියාපදිංචිව සිටියේ නම් හෝ සිටින්නේ නම්, පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනී පුහුණු පාඨමාලාවට ලියාපදිංචි කරනු ලබන දිනය වන විට ඔබ එම ලියාපදිංචිය අවලංගු කරගෙන තිබිය යුතු ය. ඔබ විශ්වවිද්‍යාලයක හෝ වෙනත් රජයේ ආයතනයක හෝ පූර්ණකාලීන පාඨමාලාවක් සඳහා ලියාපදිංචිව සිට දේශන සඳහා සහභාගි නොවූ හෝ සහභාගි නොවන අයෙක් වුව ද ඔබ එම ආයතනයේ සිසුවියකු ලෙස සලකනු ලබන බැවින්, එවැනි අයදුම්කාරියන් ද තම ලියාපදිංචිය අවලංගු කරගත යුතු ය. අවශ්‍ය අවස්ථාවලදී එය සනාථ කිරීම පිණිස ප්‍රමාණවත් ලිඛිත සාධක ඔබ සතුව තිබිය යුතු ය.

5.3 සෞඛ්‍ය, අමාත්‍යාංශය යටතේ පූර්ණකාලීන පුහුණු පාඨමාලාවල ලියාපදිංචි වී සිටින අයදුම්කාරියන් වේ නම් ඔවුන් පුහුණුවට තේරී පත්වුවහොත් ඒ වනවිට ලබමින් සිටි පුහුණුවට අදාළව අත්සන් කර තිබෙන ගිවිසුම්වලට අනුව ගිවිසුම්ගත මුදල හා ඒ වන විට ලබා ඇති සියලු දීමනාවන් ගෙවා අදළ පුහුණුවෙන් ඉවත් වුවහොත් පමණක් ඉහත පුහුණුව සඳහා ලියාපදිංචි කරනු ලැබේ.

5.4 ඔබ යම් විශ්වවිද්‍යාලයක උපාධියක් සම්පූර්ණ කර සිටින අයෙක් නම්, එම උපාධිය බලපැවැත්වෙන දිනය (EFFECTIVE DATE) මෙම පාඨමාලාවට බඳවා ගන්නා දිනට පෙර දිනයක් විය යුතු ය.

5.5 2021.02.01 වැනි දින වන විට ඔබ විශ්වවිද්‍යාලයක හෝ සෞඛ්‍ය, වෙනත් රජයේ ආයතනයක හෝ සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ හෝ පැවැත්වෙන පූර්ණකාලීන පාඨමාලාවක ලියාපදිංචි වී නොසිටි අයෙකු වුව ද යම් හෙයකින් මෙම පුහුණු පාඨමාලාවේ ලියාපදිංචි කරන දිනය වන විට ලියාපදිංචි වී සිටියේ නම් ඇය ද මෙම පුහුණු පාඨමාලාවේ ලියාපදිංචිය ලබා ගැනීමට පෙර එම පාඨමාලාවේ ලියාපදිංචිය අවලංගු කර ගත යුතු ය.

5.6 ඉහත කොන්දේසි සියල්ල සම්පූර්ණ කර තිබුණ ද අනිවාර්යයෙන්ම ඔබව මෙම පාඨමාලාව සඳහා ඇතුළත් කර ගන්නේය යන්න මෙම *ගැසට් නිවේදනයේ* කුමන හෝ වගන්තියක් මගින් අදහස් <u>නොකෙරෙන</u> බව තරයේ සිහි තබා ගත යුතු ය. එමෙන් ම ඉහත කොන්දේසි සම්පූර්ණ කර තිබුණ ද, ඔබ සුදුසුකම් ලැබීමට ප්‍රමාණවත් Z අගයක් ලබා නොමැති නම් හෝ මෙහි සඳහන් අනෙකුත් කුමන හෝ කොන්දේසියක් සම්පූර්ණ කර නොමැති නම් හෝ ඔබ කිසිදු අයුරකින් මෙම පාඨමාලාව සඳහා සුදුසුකම් නොලබන බව ඔබ දැනගත යුතු ය.

5.7 අධ්‍යාපන සුදුසුකම් හා අනෙකුත් සියලුම සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ අවසන් දිනය වන 2021.02.01 දිනට සෑම ආකාරයකින් ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

6. *අයදුම් කළයුතු ක්‍රමය* :

6.1 මෙම පුහුණු පාඨමාලාව සඳහා අයදුම් කළ යුත්තේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවිය (www.health.gov.lk) මගිනි. ඒ සඳහා මෙම අමාත්‍යාංශයේ වෙබ් අඩවියේ අදාළ කොටසේ ඇති අයදුම්පත සම්පූර්ණ කර එවිය යුතු ය. <u>අයදුම්පත සම්පූර්ණ කිරීම සඳහා උපදෙස් පත්‍රිකාව බලන්න.</u>

6.2 අයදුම්කරුවන් රු.500 ක මුදලක් ලංකා බැංකුව, තැප්‍රොබේන් ශාඛාවේ, අංක 7041318 දරන සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ ගිණුමට ගෙවිය යුතු ය. ඕනෑම ලංකා බැංකු ශාඛාවකින් හෝ මුදල් තැන්පත් කිරීමේ යන්ත්‍රයකින් හෝ අන්තර්ජාල බැංකු සේවාවක් මගින් හෝ ගෙවීම් කළ හැකි ය. මෙම ගාස්තු කවර හේතුවක් නිසා හෝ ආපසු නොගෙවන අතර, වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමට ද ඉඩ දෙනු නොලැබේ.

6.3 මෙලෙස ඔබ විසින් සාර්ථකව උඩගත කරන ලද (UPLOAD) අයදුම්පතෙහි පිටපත් <u>තැපැල් මගින් මෙම අමාත්‍යාංශය වෙත එවීමට අවශ්‍ය නොවේ</u>. එහෙත්, අයදුම්පත උඩගත කිරීමෙන් පසුව ලැබෙන අංක 5කින් යුත් කේතය, මුද්‍රිත පිටපත් පසුව ලබා ගැනීමේ පහසුව සඳහා සුරක්ෂිතව තබාගන්න. එසේම අයදුම්පතෙහි මුද්‍රිත පිටපතක් (Print out) ලබාගෙන එහි අදාළ ස්ථානයේ ඔබගේ අත්සන යොදා අත්සන සහතික කරවාගෙන සම්මුඛ පරීක්ෂණයට කැඳවුවහොත් රැගෙන ආයුතුය. (7.1 වැනි ඡේදය බලන්න)

***සටහන*** .- මෙම පාඨමාලාව සඳහා අයදුම්කිරීමට සියළු සුදුසුකම් සපුරා ඇති අයදුම්කාරියන්ට අයදුම්පත සම්පූර්ණ කිරීමේදී කිසියම් ගැටලුවක් ඇති වුවහොත් පමණක් ඒ සම්බන්ධයෙන් <u>තාක්ෂණික</u> සහාය ලබාගැනීම සඳහා සතියේ වැඩකරන දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 4.00 දක්වා කාලය තුල සෞඛ්‍ය අමාත්‍යාංශයේ <u>මානව සම්පත් කළමනාකරණ සම්බන්ධීකරණ ඒකකයේ දුරකථන අංක 0112 340 007 අමතන්න</u>. (අදල සියළු තොරතුරු මෙම *ගැසට් පත්‍රයේ* සහ සෞඛ්‍ය අමාත්‍යාංශ වෙබ් අඩවියෙහි සවිස්තරව දක්වා ඇති බැවින්, එවැනි කරුණු පිළිබඳව විමසීමෙන් වලකින්න)

7. *අයදුම්කාරියගේ අත්සන සහතික කිරීම* :-

7.1 ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරියෙකු/අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරියෙකු/ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ නිලධාරියෙකු/රජයේ විදුහල්පතිවරයෙකු/සාමදාන විනිශ්චයකාරවරයෙකු/නීතිඥවරයකු හෝ වර්ෂයකට රු. 5,12,148 කට නොඅඩු වැටුපක් ලබන ස්ථිර විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දරන රජයේ නිලධාරියෙකු විසින් අයදුම්කාරියගේ අත්සන සහතික කල යුතුය.

7.2 රජයේ හෝ අර්ධ රාජ්‍ය ආයතනවල සේවකයින්ගේ අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් එවිය යුතුය. එමෙන්ම, මෙය බාහිර බඳවා ගැනීමක් බව සිහි තබාගත යුතුය.

7.3 මෙම නිවේදනයේ දැක්වෙන නියමයන්ට අනුකූල නොවන හෝ අසම්පූර්ණ අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

8. *සම්මුඛ පරීක්ෂණය සඳහා ඔබව කැඳවනු ලැබුවහොත් ඉදිරිපත් කළ යුතු තොරතුරු* :-

8.1 ඔබ විසින් සාර්ථකව උඩගතකර ඇති විද්‍යුත් අයදුම්පත අනුව අවම අධ්‍යාපන සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කාරියන් අතුරින් Z අගය අනුව සකස් කරනු ලබන ප්‍රමුඛතා ලේඛනයක් පදනම් කරගෙන තෝරාගත් පිරිසක් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. සෞඛ්‍ය, අමාත්‍යාංශයේ ලේකම් විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් සම්මුඛ පරීක්ෂණයක් පවත්වන අතර සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් සේවා සහ මෙම *ගැසට්* නිවේදනයේ මෙම තනතුරට අදාල බඳවා ගැනීමේ පරිපාටියේ දක්වා ඇති සුදුසුකම් හා කායික යෝග්‍යතාව පරීක්ෂා කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේ දී අයදුම්කාරියන් විසින් පහත සඳහන් ලිපිලේඛනයන්හි ***මුල් පිටපත්*** ඉදිරිපත් කළ යුතු ය.

8.2 විද්‍යුත් මාධ්‍යයෙන් උඩගත කරන ලද (UPLOAD) අයදුම්පතෙහි මුද්‍රිත පිටපත (ඔබගේ අත්සන සහතික කරන ලද).

8.3 උප්පැන්න සහතිකය.

8.4 අ.පො.ස. (උ.පෙළ) විභාග ප්‍රතිඵල හා Z අගය දැක්වෙන සහතිකය (විභාග දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද).

8.5 අ.පො.ස. (සා.පෙළ) විභාග ප්‍රතිඵල ලේඛනය (විභාග දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද).

8.6 පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ රියදුරු බලපත්‍රය.

8.7 රු. 500 ක මුදල ගෙවූ බවට සනාථ කෙරෙන රිසිට්පත

8.8 පදිංචිය සනාථ කිරීම සඳහා ග්‍රාම නිලධාරී විසින් නිකුත් කරන ලද පදිංචිය පිළිබඳ සහතිකය.

8.9 අවිවාහක බව සනාථ කිරීම සඳහා සාමදාන විනිශ්චයකරුවකු ඉදිරියේ රු. 50 ක මුද්දරයක් මත අත්සන් කරන ලද විධිමත් දිවුරුම් ප්‍රකාශය

8.10 ඔබ දැනටමත් විශ්ව විද්‍යාලයක හෝ වෙනත් රජයේ ආයතනයක හෝ සෞඛ්‍ය අමාත්‍යාංශයේ හෝ පූර්ණකාලීන පාඨමාලාවක් සඳහා ලියාපදිංචි වී නොමැති නම් ඒ බවද ලියාපදිංචි වී සිටිනම් ඒ පිළිබඳ තොරතුරුද සඳහන් කර ඔබව පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනී පුහුණු පාඨමාලාවට තෝරාගතහොත් දැනටමත් ලියාපදිංචි වී ඇති පාඨමාලාවෙන් නීත්‍යානුකූලව/ ගිවිසුම් ප්‍රකාරව ඉවත්වන බවට සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් වෙත ඔබ විසින් ඉදිරිපත් කරනු ලබන බහුමාන සහතිකය. (මෙය ඔබ විසින්ම ලියනු ලබන ලිපියකි. එය වෙනත් අයෙකු විසින් සහතික කලයුතු නොවේ.)

*සටහන* :-

(*අ*) තව ද, ඉහතින් සඳහන් 8.2 සිට 8.10 දක්වා වන ලේඛනයන්හි තමා විසින්ම සහතික කරන ලද ඡායා පිටපත්, සම්මුඛ පරීක්ෂණය සඳහා සහභාගී වීමේදී රැගෙන ආ යුතු ය.

(*ආ*) පුහුණු පාසල්වල පවතින ඉඩ පහසුකම් හා සේවා අවශ්‍යතාව අනුව පුහුණුවට බඳවාගත යුතු සංඛ්‍යාව හා සම්මුඛ පරීක්ෂණයට කැඳවිය යුතු අයදුම්කරුවන් සංඛ්‍යාව, සෞඛ්‍ය, අමාත්‍යාංශයේ ලේකම් විසින් තීරණය කරනු ලැබේ.

(*ඇ*) සම්මුඛ පරීක්ෂණයට පැමිණෙන සියලු දෙනාම පුහුණුවට බඳවා ගන්නා බවක් මෙහි අඩංගු කිසිදු වගන්තියකින් අදහස් නොකෙරේ.

09. *පුහුණු කිරීමේ පරිපාටිය* :-

9.1 සම්මුඛ පරීක්ෂණයට ලක් කරන ලද අයදුම්කාරියන් අතුරින් තෝරා ගත් අයදුම්කාරියන් මෙම පුහුණු පාඨමාලාව හැදෑරීම සඳහා පුහුණු පාසල්වලට ඇතුළත් කරනු ලැබේ. පාඨමාලා කාලය සහ හැදෑරිය යුතු මාධ්‍යය අංක 1 වගුවේ දක්වා ඇත.

9.2 පුහුණු පාසල්වලට ඇතුළත් කරන අභ්‍යාසලාභිනියන්ගේ පුහුණු පාසල්වල බලපැවැත්වෙන නීතිරීතිවලට හා සෞඛ්‍ය, අමාත්‍යාංශය මගින් කලින් කලට පනවනු ලබන වෙනත් නියෝගවලට ද යටත් වනු ඇත.

9.3 පුහුණුව ලබන කාලපරිච්ඡේදය තුළ නියමිත විභාගවලින් අසමත්වන හෝ වැඩ හා හැසිරීම අසතුටුදායක වන හෝ විභාග නිවාඩු කොන්දේසි පිළිපැදීමට අපොහොසත්වන හෝ පුහුණුවට බඳවා ගැනීම සඳහා ඉදිරිපත් කර තිබෙන අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් අසත්‍ය බවට හෙළි වුවහොත් හෝ එවැනි අභ්‍යාසලාභිනියන්ගේ පුහුණුව, ඕනෑම අවස්ථාවක දී වන්දි ගෙවීමකින් තොරව අවසන් කළ හැකි ය.

9.4 පුහුණුව ලබන කාලපරිච්ඡේදය තුළ දී අභ්‍යාසලාභිනියන්ට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි උපලේඛන V හි විධිවිධාන වලට අනුව මාසික දීමනාවක් ගෙවනු ලැබේ.

9.5 පුහුණු පාසලට ඇතුළත් කරනු ලබන අවස්ථාවේදී පුහුණුව සාර්ථකව නිම කරන බවටත්, පුහුණු පාඨමාලාව අත්හැර නොයන බවටත්, එකී පුහුණුව සම්පූර්ණයෙන්ම නිම කිරීමෙන් පසු අදාළ තනතුරේ පත්වීම ලදහොත් අවම වශයෙන් වසර දහයක (10) කාල පරිච්ඡේදයක් රාජ්‍ය සේවය යටතේ/පළාත් රාජ්‍ය සේවය යටතේ සේවය කරන බවටත්, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් සමග ගිවිසුමකට හා ඇපකරයකට එළඹිය යුතු ය. ඉහත 9.3 කරුණු ප්‍රකාරව, පුහුණු කාලසීමාව තුළ දී පුහුණුවෙන් ඉවත් වුවහොත්, පුහුණුව හැර ගියහොත්, පුහුණුවෙන් ඉවත් කිරීමට සිදු වුවහොත් හෝ පත්වීම ලැබ වර්ෂ දහයක (10) කාලපරිච්ඡේදයක් ඉහත පරිදි අදාළ, තනතුරේ සේවය කිරීමට අපොහොසත් වුවහොත් පුහුණු කාලය තුළ දී

ඇයට ගෙවන ලද දීමනාව, රජය විසින් දරන ලද වියහියදම් හා ගිවිසුම්ගත මුදල ඇය විසින් සෞඛ්‍ය අමාත්‍යාංශයට ගෙවිය යුතු ය. එසේ නොමැති වුවහොත්, එම මුදල් අයකර ගැනීමට ගිවිසුම් ප්‍රකාර නීත්‍යානුකූලව කටයුතු කිරීමට පියවර ගනු ඇත.

10. *සේවයේ නියුක්ත කරවීමේ නියමයන්* :-

10.1 පුහුණුව අවසානයේ ස්ථිර පත්වීම් ප්‍රදානය කිරීමට රජය බැඳී නොසිටී. එහෙත්, පුහුණුව අවසන් කරන දිනය වන විට පවත්නා වූ පුරප්පාඩු මත සකස් කරන ප්‍රමුඛතා පුරප්පාඩු ලේඛනය අනුව ජ්‍යෙෂ්ඨ නිලධාරිනියන් වෙත ස්ථාන මාරු ලබා දීමෙන් අනතුරුව ඉතිරිවන පුරප්පාඩු සඳහා පුහුණුව සාර්ථකව නිමකර අවසන් පරීක්ෂණය සමත්වන අභ්‍යාසලාභීන්ගේ පුහුණු පාඨමාලාවේ අවසන් පරීක්ෂණ කුසලතාවය සැළකිල්ලට ගෙන අදාළ තනතුරේ III වන පංතියේ තනතුරකට පත් කිරීම සඳහා සළකා බලනු ලැබේ. එලෙස තෝරා ගනු ලබන සිසුවියන් පවතින පුරප්පාඩු අනුව ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා පත්කිරීමට යටත් වේ.

10.2 පුහුණු කාලය අවසානයේ දී ස්ථිර පත්වීම් ප්‍රදානය කළහොත් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි විධිවිධාන පරිදි වැටුප් ගෙවනු ලැබේ.

10.3 අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් පිළිබඳ විස්තර අයදුම්පත පිරවීමේ දී ඉතා සැලකිළිමත්ව හා නිවැරදිව ඇතුළත් කළ යුතු ය. පුහුණුව සඳහා බඳවා ගැනීමෙන් හෝ පත්වීම් ලැබීමෙන් පසුව හෝ ඉහත කී සහතික ව්‍යාජ බවට ඔප්පු වුවහොත් නීත්‍යානුකූලව කටයුතු කිරීම සඳහා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමටත්, දෙනු ලබන පත්වීම අවලංගු කර පුහුණුවෙන්/ තනතුරෙන් පහකරන අතර, ඒ සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කර නැවත රජයේ සේවයට නොගන්නවුන්ගේ අසාධු ලේඛනයට ඇයගේ නම ඇතුළත් කිරීමටත් කටයුතු කරනු ලැබේ. තවද, පුහුණු කාලය තුළ දී ඇයට ගෙවන ලද දීමනාව රජය විසින් දරන ලද වියහියදම් හා ගිවිසුම්ගත අදාළ මුදල ඇයගෙන් අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ.

10.4 තෝරාගත් අයදුම්කාරියන් අදාළ පාඨමාලාව හැදෑරීමට හා දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට කායික හා මානසික යෝග්‍යතාවයකින් හෙබි බව සනාථ කරනු පිණිස පුහුණුවේ පළමු මාසය ඇතුළත වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර, වෛද්‍ය පරීක්ෂණයේ දී අයෝග්‍ය බව පෙනී යන අයදුම්කාරියන් පාඨමාලාවේ රැඳී සිටීමට නුසුදුස්සන් වනු ඇත.

10.5 ඉහත පරිදි බඳවා ගන්නා ලද සියළුම දෙනා *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ* විධිවිධානයන්ට, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් රජයේ සේවය සම්බන්ධව පනවන ලද රීති, රෙගුලාසි හා නියෝගවලට, සේවා ව්‍යවස්ථාවල විධිවිධානයන්ට, රජයේ මුදල් රෙගුලාසිවලට, රජයේ චක්‍රලේඛ හා උපදෙස්වලට හා ඒවාට අදාළව වරින්වර පනවනු ලබන නියමවලට හා සංශෝධනවලට ද යටත් වනු ඇත.

10.6 පුහුණුවට බඳවා ගනු ලබන අයදුම්කාරියන් සඳහා පුහුණු පාසල්වල නේවාසික පහසුකම් සැපයීමට මෙම අමාත්‍යාංශය බැඳී නොසිටී. එසේ ලබාදෙන්නේ නම්, ඒ සඳහා තක්සේරු නිවාස කාමර කුලිය, ජල හා විදුලි බිල්පත් අය කරනු ලැබේ.

10.7 මෙම පුහුණු කාලසීමාව තුළ දී වෘත්තීය සමිති කටයුතුවල යෙදීම හෝ පෞද්ගලික සේවයේ යෙදීමට හෝ කිසිම අයිතිවාසිකමක් නොමැත. එසේම, පුහුණුවෙන් පසුව ඔබ අදාළ තනතුරේ පත්වීම් ලදහොත්,_ඔබට පෞද්ගලික සේවයේ යෙදීමට කිසිඳු අයිතිවාසිකමක් නොමැත. එවැන්නක් සිදුකර අනාවරණය වුවහොත් නීත්‍යානුකූලව කටයුතු කිරීමට පියවර ගනු ලැබේ.

10.8 පුහුණුවට බඳවා ගැනීම සම්බන්ධයෙන් මෙම *ගැසට්* නිවේදනය මගින් ආවරණය වන හෝ නොවන යම් කරුණක් සම්බන්ධයෙන් යම් ගැටළු සහගත තත්ත්වයක් උදාවුවහොත්, ඒ පිළිබඳ සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වනු ඇත. මෙම *ගැසට්* නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි පාඨ අතර යම් පරස්පරතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේ ය.

වෛද්‍ය එස්. එච්. මුණසිංහ,
ලේකම්,
සෞඛ්‍ය වෛද්‍ය අමාත්‍යාංශය.

2020 දෙසැම්බර් මස 21 වැනි දින,
"සුවසිරිපාය"
අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

01-28

**අධ්‍යාපන අමාත්‍යාංශය**

## ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරීන් සඳහා වන පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2020

ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරින් සඳහා වන පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය 2021 අප්‍රේල් මස පැවැත්වෙන බව මෙයින් දැනුම් දෙමි.

02. මෙම විභාගයට අදාළ විෂය නිර්දේශය හා අනෙකුත් විධිවිධාන අංක 1928/28 දරන 2015.08.21 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කර ඇත. පහසුව සඳහා එම විෂය නිර්දේශය සහ අනෙකුත් විධිවිධාන පහත දක්වා ඇත.

03. *විභාගය පිළිබඳ විස්තර.-*

| *ප්‍රශ්න පත්‍රය* | *කාලය* | *මුළු ලකුණු* | *සමත් ලකුණු* |
|---|---|---|---|
| I. සාමාන්‍ය පරිපාලනය | කාලය පැය 03 | 100 | 40 |
| II. මුදල් රෙගුලාසි | කාලය පැය 03 | 100 | 40 |
| III. අධ්‍යාපන නීතිය පරිපාලනය හා ඇගයීම | කාලය පැය 03 | 100 | 40 |

04. විභාගය පවත්වනු ලබන බලධාරියා : විභාග කොමසාරිස් ජනරාල්

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* |
|---|---|
| I. සාමාන්‍ය පරිපාලනය | (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හා ඊට පෙර පැවති 1972 හා 1974 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා<br>• ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තිය<br>• මානව හිමිකම් කොමිෂන් සභා පනත<br>• අල්ලස් හා දූෂණ පනත<br><br>(ආ) කාර්යාලයීය සහ ක්ෂේත්‍ර සංවිධාන ක්‍රම සහ ආයතන සංග්‍රහයේ පරිච්ඡේද (කාලානුරූපීව සිදුවන සංශෝධනයන් ද ඇතුලුව) VII, IX, X, XVI, XXV, XXVI, XXVII, XXIX, XXXI, XXXII, XLVII, XLVIII<br><br>(ඇ) රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති |
| II. මුදල් රෙගුලාසි | (අ) රජයේ මුදල් රෙගුලාසි (I වන පරිච්ඡේදය හැර/ කාලානුරූපීව සිදුවන සංශෝධනයන් ද ඇතුලුව)<br>(ආ) ප්‍රවර්තන වර්ෂයේ ආදායම් සහ වැය ඇස්තමේන්තු. උදා :- ඒවායේ සැකැස්ම, ආදායම් ශීර්ෂ, මුදල් හා විසර්ජන පනත්.<br>(ඇ) අධ්‍යාපන කාර්යාල මගින් ඉටු කරනු ලබන නිශ්චිත ගිණුම් කටයුතුවලට අදාළ ආඥාපනත් සහ වෙනත් නීති ප්‍රඥප්ති. |
| III. අධ්‍යාපන නීතිය, පරිපාලන හා ඇගයීම | (අ) අධ්‍යාපනයට අදළ නීතියේ විධිවිධාන<br>• 1939 අංක 31 දරන අධ්‍යාපන ආඥාපනත<br>• 1947 අංක 26 දරන සංශෝධන පත්‍රය<br>• 1951 අංක 05 දරන සංශෝධන පත්‍රය<br>• 1953 අංක 43 දරන සංශෝධන පත්‍රය<br>• රජයේ පාසල් පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහය<br>• 1960 අංක 05 දරන උපකෘත පාසල් සහ ගුරු විද්‍යාල (විශේෂ විධිවිධාන) සංශෝධන පනත<br>• 1961 අංක 08 දරන උපකෘත පාසල් සහ ගුරු විද්‍යාල (අතිරේක විධිවිධාන) පනත<br>• 1973 අංක 35 දරන අධ්‍යාපන (පදවි නාම වෙනස් කිරීමේ) පනත<br>• 1981 අංක 65 දරන උපකෘත පාසල් සහ ගුරු විද්‍යාල (විශේෂ විධිවිධාන) සංශෝධන පනත<br>• 1985 අංක 28 දරන ජාතික අධ්‍යාපන ආයතන පනත |

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* |
|---|---|
| *(සබන්ධිතයි)*<br>III. අධ්‍යාපන නීතිය, පරිපාලන හා ඇගයීම | *(අ)* • 1968 අංක 25 දරන ප්‍රසිද්ධ විභාග පනත.<br>• 1986 අංක 30 දරන අධ්‍යාපන විද්‍යාපීඨ පනත<br>• ජාතික අධ්‍යාපන කොමිෂන් සභා වාර්තා (විභාගයට ආසන්න වසර තුනක් තුළ)<br>• පහසුකම් හා සේවා ගාස්තු<br>• ආදි ශිෂ්‍ය සංගම් සහ පාසල් සංවර්ධන සමිතිවලට අදාළ චක්‍රලේඛ<br><br>*(ආ)* අධ්‍යාපන පරිපාලනය<br>1. (i) අධ්‍යාපන අමාත්‍යාංශය<br>(ii) පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු ද ඇතුළුව අමාත්‍යාංශය යටත් ඇති දෙපාර්තමේන්තු සහ ආයතනවල සහ අධ්‍යාපන අමාත්‍යාංශයේ සංවිධානය හා කාර්යයන්<br>(iii) ජාතික හා පළාත් මට්ටමින් අධ්‍යාපනික සැලසුම්කරණය හා පොදු අභිමතාර්ථ (අරමුණු) (පාසල් සැකසුම් ඇතුළුව) ක්‍රියාත්මක කිරීම යනාදිය.<br>2. පාසල් කළමනාකරණය හා පාසල් ප්‍රජා සම්බන්ධතා.<br>3. අධ්‍යාපන කළමනාකරණ තොරතුරු පද්ධතිය (EMIS)<br>4. විශේෂ අධ්‍යාපන වැඩසටහන්, නොවිධිමත් අධ්‍යාපන කටයුතු, පාසල් පාදක කළමනාකරණය.<br><br>*(ඇ)* ඇගයීම්<br>• ගුරුවරුන්ගේ කාර්ය සාධනය ඇගයීම සඳහා උපයෝගි කරගන්නා උපමාන<br>• පාසල් පාදක ඇගයීම්<br>• පාසල්වල ස්වයං ඇගයීම් වැඩසටහන්<br>• කලාප අධ්‍යාපන කාර්යාල, පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු සහ අධ්‍යාපන අමාත්‍යාංශය මගින් පාසල් අධීක්ෂණය කිරීම<br>• බාහිර කණ්ඩායම් මගින් අභ්‍යන්තර ඇගයීම් සුපරීක්ෂණය (අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති අත්පොත් හා වෙනත් ප්‍රකාශන පිළිබඳ මනා අවබෝධයක් ඇති කර ගන්නා ලෙස අපේක්ෂකයින්ට උපදෙස් දෙනු ලැබේ.) |

*සැ.යු.*-ප්‍රශ්න පත්‍ර තුනම කෙටි ප්‍රශ්න හා ව්‍යුහගත මාදිලියේ ප්‍රශ්න වලින් සමන්විත වේ.

06. නිලධාරියකුට I වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයට නියමිත විෂයයන් සඳහා එකම වතාවක දී හෝ වෙන වෙනම අවස්ථා කිහිපයක දී හෝ පෙනී සිටිය හැකි ය.

07. *විභාගයේ භාෂා මාධ්‍යය :*

I. විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂා මාධ්‍යයන්ගෙන් පැවැත්වේ.
II. අපේක්ෂකයින් කැමති එක් භාෂාවකින් පමණක් විභාගයට පෙනී සිටිය යුතු යි.
III. අපේක්ෂකයා රාජ්‍ය සේවයට ඇතුළුවීම සඳහා පෙනී සිටි තරග විභාගයේ භාෂා මාධ්‍යය හෝ තරග විභාගයක් නොමැතිව රජයේ සේවයට බැඳුණු අය සම්බන්ධයෙන් රජයේ සේවයට ඇතුළුවීමට සුදුසුකම් ලැබූ විභාගයට පෙනී සිටි භාෂා මාධ්‍යයෙන් පිළිතුරු ලිවිය හැකි ය.

08. අපේක්ෂකයකු තමාට හිමිකම් නොමැති මාධ්‍යයකින් විභාගයට පෙනී සිටින බැව් හෙළිවුවහොත් ඔහුගේ/ ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. විභාගයට පෙනී සිටීමට ඉල්ලුම් කරන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

09. අයදුම්පත් පහත දැක්වෙන ආකෘතියට අනුව A-4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්ත භාවිතා කරමින් ඉදිරිපත් කළ යුතු ය. (අයදුම්පතෙහි අංක 01 සිට 06 තෙක් ඡේදයන් පළමුවන පිටුවෙහිත් ඉතිරිය දෙවන පිටුවෙහිත් වන ලෙස සඳහන් කරන්න) සිංහල අයදුම්පතෙහි විභාගයේ නම සිංහලට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන් ද, දෙමළ අයදුම්පතෙහි විභාගයේ නම දෙමළට අමතරව

ඉංග්‍රීසි භාෂාවෙන් ද සඳහන් කළ යුතු ය. අදාළ තොරතුරු තම අත් අකුරෙන්ම පැහැදිළිව ඇතුළත් කළ යුතු ය. ආදර්ශ අයදුම්පතට අනුකූල නොවන අයදුම්පත්‍ර හා අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත් පූර්ව දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. සම්පූර්ණ කරනු ලබන අයදුම්පත විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පතට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු අතර, එසේ අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප වනු ඇත.

10. *විභාග ප්‍රතිඵල :*

i. විභාගය පැවැත්වීම සහ ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසන් තීරණය වනු ඇත.

ii. විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන්ගේ ප්‍රතිඵල ඇතුළත් ප්‍රතිඵල ලේඛන විභාග කොමසාරිස් ජනරාල් විසින් ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ලබා දෙනු ඇත.

11. අයදුම්පත් 2021 ජනවාරි 29 දිනට හෝ ඊට ප්‍රථම විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන (ආයතනික හා විදේශ විභාග) ශාඛාව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ. පෙ. 1503, කොළඹ යන ලිපිනයට ලැබෙන පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. ලිපි කවරයේ වමත්පස ඉහළ කෙළවරේ විභාගයේ නම සඳහන් කළ යුතු ය. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

12. නිවේදනයේ සඳහන් අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර විභාග ගාස්තු ගෙවීම අදාළ නම් ඊට අදාළ නියමිත විභාග ගාස්තුව ගෙවා ලබාගත් ලදුපත සමග විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය අයදුම්කරුගේ අත්සන, දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය ද සහිතව නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශපත්‍ර නිකුත් කරනු ඇත. අයදුම්කරුවන් වෙත ප්‍රවේශපත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් පුවත්පත්වල හා දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 2ක් හෝ 3ක් ගත වූ පසුවත් යම් අයදුම්කරුවකුට ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතු ය. එසේ දැන්වීමේ දී ඔහු/ඇය ළඟ තබාගත් අයදුම්පතේ, මුදල් ගෙවා ලබාගත් කුවිතාන්සියේ හා අයදුම්පත ලියාපදිංචි තැපෑලෙන් යොමු කරන ලද කුවිතාන්සියේ සහතික කළ ඡායා පිටපත් සමග එම ඉල්ලීම් ලිපිය ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත එවීම වඩාත් ඵලදායි වනු ඇත. (ෆැක්ස් අංකය : - 011-2784232) අයදුම්කරු කොළඹින් බැහැර ප්‍රදේශයක නම් ප්‍රවේශ පත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක් ද සඳහන් කිරීම අවශ්‍ය වේ.

13. ඉහත 12 වැනි ඡේදයේ සඳහන් කර ඇති අවශ්‍යතාවයන් සපුරාලීමට අපොහොසත්වන අපේක්ෂකයින් විසින් පසුව ඉදිරිපත් කරන පැමිණිලි සලකා බලනු නොලැබේ.

14. විභාග අපේක්ෂක/අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළදී තමන් පෙනී සිටින සෑම විෂයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

i. ජාතික හැඳුනුම්පත,
ii. වලංගු විදෙස් ගමන් බලපත්‍රය,
iii. වලංගු ශ්‍රී ලාංකික රියැදුරු බලපත්‍රය,

එමෙන්ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද, විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරීන්ට අයදුම්කරු හඳුනාගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

15. මෙම විභාගයට පෙනී සිටින අපේක්ෂකයින්ගේ පහත සඳහන් පදනම මත විභාග ගාස්තු අය කිරීමට තීරණය කර ඇත. අදාළ විභාග ගාස්තුව විභාග කොමසාරිස් ජනරාල්ගේ අදායම් ශීර්ෂ 20-03-02-13ට බැර වන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම තැපැල්/ උප තැපැල් කාර්යාලයකට ගෙවා ලබා ගන්නා ලදුපත අයදුම්පතේ නියමිත ස්ථානයේ එක් දාරයක් පමණක් සිටින සේ ඇලවීමට කටයුතු කරන්න. (ලදුපතේ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)

*(අ)* පළමු වතාව (සම්පූර්ණ විභාගය හෝ කොටසක් සඳහා ගාස්තු අය නොකෙරේ.)
*(ආ)* ඉන්පසු එක් එක් වතාවක් සඳහා-

සම්පූර්ණ විභාගය සඳහා - රු. 1,200.00 යි.
එක් විෂයකට - රු. 600.00 යි.

16. I. අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු ය.

II. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන

නීතිරීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත. තව ද, රටේ පවතින නිරෝධායන නීතිරීතිවලටද අපේක්ෂකයින් අවනත විය යුතු වේ.

17. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවයක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

18. මෙම නිවේදනය මගින් ආවරණය නොවන කිසියම් කාරණයක් වෙතොත් ඒ පිළිබඳව තීරණය ගැනීමේ අයිතිය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා සතු ය.

මහාචාර්ය කේ. කපිල පී. කේ. පෙරේරා,
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

2020 දෙසැම්බර් මස 21 වැනි දින,
බත්තරමුල්ල,
ඉසුරුපාය,
අධ්‍යාපන අමාත්‍යාංශයේ දී ය.

**ආදර්ශ අයදුම්පත**

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

***ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරීන් සඳහාවන පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2020***
***First Effeciency Bar Examination for Officers of the Sri Lanka Education Administrative Service - 2020***

නිලධාරියා විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය : සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4 (අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

(විභාගයේ නම ලිපි කවරයේ වමත් පස ඉහළ කෙළවරේ සඳහන් කළ යුතුය.)

01. (i) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :
*උදා.* : HENAGE DON SHIRAL GAYANTHA GUNASEKARA :————.
(ii) අගට යෙදෙන නම මුලින් ද අනෙකුත් නම්වල මුලකුරු පසුව ද යොදා නම : (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
*උදා.* : GUNASEKARA H. D. S. G. :————.
(iii) සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

02. ලිපිනය :
(i) විභාග ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(ii) රාජකාරි ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :————.
(iii) පෞද්ගලික ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :————.

03. ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | | | |

04. ස්ත්‍රී/පුරුෂ භාවය :

පුරුෂ - 0
ස්ත්‍රී - 1

(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

05. ජංගම දුරකතන අංකය : | | | | | | | | | | |

06. නිවේදනයේ 03 වන ඡේදය යටතේ වගුවේ දක්වා ඇති විෂයය අංකය සහිතව ගන්නා විෂයයන් පැහැදිලිව සඳහන් කළ යුතුය.

| *විෂයය* | *විෂයය අංකය* |
|---|---|
| | |
| | |
| | |

07. උපන් දිනය : වර්ෂය : | | | | | මාසය : | | | දිනය : | | |

08. පදවි නාමය :————.

09. දෙපාර්තමේන්තුව/කලාප අධ්‍යාපන කාර්යාලය/කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය/පාසල :————.

10. මෙම විභාගයට කලින් සම්පූර්ණයෙන් හෝ කොටසකට හෝ පෙනී සිටියේ නම් එසේ පෙනී සිටි වර්ෂය, විෂය හා මාධ්‍යය සඳහන් කරන්න.

| *වර්ෂය* | *විෂයය* | *මාධ්‍යය* |
|---|---|---|
| ……… | ………………. | ………………. |
| ……… | ………………. | ………………. |

11. විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර :
(i) විභාග ගාස්තු ගෙවූ තැපැල් කාර්යාලය :————.
(ii) ලදුපත් අංකය හා දිනය :————.
(iii) ගෙවූ මුදල :————.

| |
|---|
| මුදල් ගෙවා ලදුපත මෙහි අලවන්න. (ඡායා පිටපතක් ළඟ තබා ගන්න, අදාළ නම් පමණි.) |

12. ඉහත දැක්වෙන විස්තර නිවැරදි බවත්, අයදුම්පතේ දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් මෙම විභාගයට පෙනී සිටීමට හිමිකම් ඇති බවත්, විභාගය සම්බන්ධයෙන් වන සියලු ම නීති රීතිවලට එකඟ වන බවත් ප්‍රකාශ කරමි. තවද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට සහ ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ගනු ලබන තීරණවලට මම යටත් වන බවද ප්‍රකාශ කරමි.

————,
අපේක්ෂකයාගේ අත්සන.

දිනය :————.

*විභාග කොමසාරිස් ජනරාල් :*

මෙම විස්තරය දැක්වෙන අපේක්ෂකයාට/අපේක්ෂිකාවට මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ඇති බවත්, අයදුම්පතේ ඔහු/ඇය විසින් සඳහන් කර ඇති භාෂා මාධ්‍යයෙන් පෙනී සිටීමට ඔහුට/ඇයට සුදුසුකම් ඇති බවත් මම සහතික කරමි.

මුදල් ගෙවූ ලදුපත ඉහත අලවා ඇතිබවද ප්‍රකාශ කරමි. (*)

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන,
පදවි නාමය සහ නිල මුද්‍රාව.

දිනය :————.

(*) ගාස්තු ගෙවීමට අවශ්‍ය නොවේ නම් කපා හරින්න.

01-02

## ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ II ශ්‍රේණියේ නිලධරයන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2018 (I)(2021)

ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ අනුමත සේවා ව්‍යවස්ථාවට අනුකූලව යථෝක්ත විභාගය, විභාග කොමසාරිස් ජනරාල් විසින් 2021 අප්‍රේල් මස කොළඹ දී පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

01. (i) මෙම විභාගය, විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන අතර, විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ඔහු විසින් නියම කරන ලද නීති රීතිවලට විභාග අයදුම්කරුවන් යටත් වේ. මෙම නීති රීති උල්ලංඝනය කළහොත්, විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට ඔවුනට සිදුවෙනවා ඇත.

(ii) අයදුම්කරුවන් සඳහා පනවා ඇති නීති, ගැසට් නිවේදනයේ මුල වෙනම මුද්‍රණය කර ඇත.

03. මෙම විභාග සඳහා ඉල්ලුම් කිරීමේ ආදර්ශ අයදුම් පත්‍රය මෙම නිවේදනයේ අවසානයේ පළ කර ඇත. එම ආදර්ශ අයදුම් පත්‍රය අනුව අයදුම්කරුවන් ස්වකීය අයදුම් පත්‍රය පිළියෙල කර ගත යුතු අතර, ඒ අනුව ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ මධ්‍යම රාජ්‍ය සේවයේ නිලධරයකු නම්, තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මාර්ගයෙන් ද, ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ පළාත් රාජ්‍ය සේවයේ නිලධරයෙකු නම්, ඔවුන් සේවය කරන පළාත් සභාවේ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් මගින් ද, 2021.02.08 දින හෝ ඊට පෙර ලැබෙන් සේ, ''විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන (ආයතනික හා විදේශ විභාග) ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ. පෙ. 1503, කොළඹ'' යන ලිපිනය වෙත එම අයදුම්පත්‍රය ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවන කවරයේ වමත් පස ඉහළ කෙළවරේ '' ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ II ශ්‍රේණියේ නිලධරයන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2018(I) (2021) '' ලෙස සඳහන් කළ යුතු ය. අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

03. අනන්‍යතාව :

විභාග අපේක්ෂක/අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාවය සනාථ කළ යුතු ය. ඒ සඳහා පහත දැක්නෙ කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

(අ) ජාතික හැඳුනුම්පත.
(ආ) වලංගු විදේශ ගමන් බලපත්‍රය.
(ඇ) වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

එමෙන්ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාවය තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා දෙකන් අවාරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතු ය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරීන් අයදුම්කරු හඳුනාගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතු ය.

05. අයදුම්පත්‍රය :

(i) ආදාර්ශ අයදුම්පතට අනුකූලව "ඒ 4" ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්ත භාවිතා කරමින් අයදුම්පත පිළියෙල කළ යුතුය. අංක 01 සිට 06 තෙක් පළමුවන පිටුවට ද ඉතිරිය අනෙක් පිටුවලට ද ඇතුළත් විය යුතුය. අයදුම්පත යතුරු ලියනය කර පිළියෙල කරගත හැකි වුව ද, එය නිවැරදිව හා පැහැදිලිව අයදුම්කරුගේ අත් අකුරින් ම පිරවිය යුතුය. අයදුම්කරුවන් මෙම විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යයෙන් අයදුම්පත පිරවිය යුතුය.

(ii) අයදුම්පත පිළියෙල කරගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම, සිංහල මාධ්‍ය අයදුම්පත්‍රවල සිංහල භාෂාවට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන් ද, දෙමළ දෙමළ අයදුම්පත්‍රවල දෙමළ භාෂාවට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන් ද යෙදිය යුතුය. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන අයදුම්පත් අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්කරු විසින් සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් ම විමසා බැලිය යුතු අතර, එම අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

(iii) පළමුවන වරට මෙම විභාගයේ එක් විෂයකට හෝ විෂයයන් දෙකටම අයදුම්කරන නිලධරයන් විසින් කිසිදු විභාග ගාස්තුවක් ගෙවිය යුතු නොවේ. එසේ වුවත් ඉන්පසු වාරවල දී නිලධරයන් විභාගයට අයදුම් කරන්නේ නම් සම්පූර්ණ විභාගය සඳහා

රු. 500 ක විභාග ගාස්තුවක් ද, එක් විෂයයක් සඳහා පෙනී සිටින්නේ නම් රු. 250 ක විභාග ගාස්තුවක් ද, ගෙවිය යුතුය. විභාග ගාස්තුව අයදුම්පත් භාරගන්නා අවසන් දින හෝ ඊට පෙර විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 20-03-20-13ට බැර වන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම තැපැල් කාර්යාලයකට හෝ උපතැපැල් කාර්යාලයකට හෝ ගෙවා ලබාගන්නා ලදුපත අයදුම්පතේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ ඇලවිය යුතුය. මෙම ලදුපතේ ඡායා පිටපතක් අයදුම්කරු ලඟ තබාගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. කවර හේතුවක් යටතේ වුව ද මෙම ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ. මෙම විභාගය සඳහා ගෙවනු ලබන ගාස්තුව වෙනත් කිසිඳු විභාගයකට මාරු කිරීමට ද ඉඩදෙනු නොලැබේ.

(iv) මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පැවැත්වේ. අයදුම්කරුවෙකු තමාට අදාළ එක් මාධ්‍යයක් තෝරා ගත යුතු අතර විභාගයට නියමිත සියලුම ප්‍රශ්න පත්‍ර සඳහා එම මාධ්‍යයෙන් පිළිතුරු සැපයිය යුතුය. ඉල්ලුම් කරන ලද මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

(v) අයදුම්පත් භාරගන්නා අවසන් දින වන විට ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ II ශ්‍රේණියට උසස්වීම් ලද නිලධරයන්ට දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගයට පෙනී සිටිය හැක.

(vi) **ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ ෂෂෂ ශ්‍රේණියේ නිලධරීන්ට දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහා ඉල්ලුම් කළ නොහැක.**

05. (i) ගැසට් නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් අයදුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර විභාග ගාස්තු ගෙවා අදාළ නම් ඊට අදාළ ලදුපත සමග විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය, අයදුම් කරන විභාගය, අයදුම්කරුගේ අත්සන හා අත්සන සහතික කිරීම ද, දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය ද සහිතව නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශපත්‍ර නිකුත්කරනු ඇත. අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළකරනු ඇත.

නිවේදනය පළ වී දින 2ක් හෝ 3ක් හෝ ගත වූ පසුවත් ප්‍රවේශපත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුය. එහිදී අයදුම්කරුගේ සම්පූර්ණ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා විභාගයේ නම සඳහන් කළ යුතු අතර එසේ විමසන අවස්ථාවේ අයදුම්කරු විසින් ළඟ තබා ගත් අයදුම්පත්‍රයේ පිටපත, විභාග ගාස්තු ගෙවීම අදාළ නම් ලදුපතේ පිටපත හා අයදුම්පත තැපැල් කිරීමේ දී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය අතැතිව සිටීම වැදගත් වේ. කොළඹින් බැහැර අයදුම්කරුවෙකු නම් ෆැක්ස් මගින් ප්‍රවේශපත්‍රයේ පිටපතක් ලබාගැනීම සඳහා අයදුම්කරුගේ ෆැක්ස් අංකයක් හා ඉහත දක්වා ඇති තොරතුරු ද සඳහන් කරන ලද ඉල්ලීම් ලිපියක් ෆැක්ස් මගින් විභාග දෙපාර්තමේන්තුව වෙත යොමු කරමින් විමසා සිටීම ද ප්‍රතිඵලදායී වනු ඇත.

ඉහත අවශ්‍යතාවන් සපුරාලීමට අපොහොසත් වන අයදුම්කරුවන් විසින් පසුව ඉදිරිපත් කෙරෙන ලියවිලි සලකා බලනු නොලැබේ.

(ii) විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ අයදුම්කරුගේ අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බළය පවරන ලද නිලධාරයෙකු ලවා සහතික කරවා ගත යුතු ය. විභාගයට පෙනී සිටින නිලධරයන් විසින් විභාග ශාලාධිපති වෙත ඔවුන්ගේ අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍ර පමණක් ඉදිරිපත් කළ යුතු ය. එවැනි ප්‍රවේශ පත්‍රයක් නොමැතිව විභාගයට පෙනී සිටිමට අවසර දෙනු නොලැබ්.

06. දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත්වීමට අදළ නියමිත කාලය තුළ තම අභිමතය පරිදි, එක් එක් විෂයය සඳහා වෙන් වෙන් වශයෙන් හා එකිනෙකට වෙනස් වූ වාරවලදී පෙනී සිටීමට නිලධරයන්ට හැකිවේ. එතෙකුදු වුවත් සාමාර්ථ්‍යයක් සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රයකින් අවම වශයෙන් 40% ක ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතුය.

07. *විභාග ප්‍රතිඵල නිකුත් කිරීම* :

පළාත් රාජ්‍ය සේවායේ නිලධරයන්ගේ ප්‍රතිඵල අදළ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ද, මධ්‍යම රාජ්‍ය සේවයේ නිලධරයන්ගේ ප්‍රතිඵල රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් වෙත ද නිකුත් කිරීමට කටයුතු කරනු ලැබේ.

07. ඉහත (06) වැනි ඡේදයේ සඳහන් කර ඇති අවශ්‍යතාවන් සපුරාලීමට අපොහොසත් වන අපේක්ෂකයන් විසින් පසුව ඉදිරිපත් කෙරෙන ලියකියවිලි සලකා බලනු නොලැබේ.

08. *විභාග පටිපාටිය* :

(1) II ශ්‍රේණියේ නිලධරයන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය පහත සඳහන් ප්‍රශ්න පත්‍ර 02න් සමන්විත වේ.

විෂය අංකය (03) - ආයතන සංග්‍රහය (කාලය පැය 02 කි) ලකුණු 100 යි

විෂය අංකය (04) - මුදල් රෙගුලාසි - (කාලය පැය 02 කි) ලකුණු 100 යි

<u>ආයතන සංග්‍රහය (විෂය අංකය - 03) - විෂය නිර්දේශය</u>

මෙම ප්‍රශ්න පත්‍රය ආයතන සංග්‍රහයේ පහත සඳහන් පරිච්ඡේද මත සැකසේ.

XV වන පරිච්ඡේදය අධ්‍යයන, අභ්‍යාස හෝ රාජකාරී කටයුතු සඳහා පිටරට යෑම
XVI වන පරිච්ඡේදය නිවාඩු ගමන්
XXIII වන පරිච්ඡේදය ඇතැම් වර්ගවල ලෙඩ රෝගවලින් පෙළෙන රජයේ නිලධරයන්ට විශේෂ අනුග්‍රහ සහ ඒ පිළිබඳ කොන්දේසි
XXIV වන පරිච්ඡේදය වැටුප් ණය හා අත්තිකාරම්
XXV වන පරිච්ඡේදය වෘත්තිය සංගම්වල සාමාජිකයින්ට අනුග්‍රහ
XXVII වන පරිච්ඡේදය ලිපි ගනුදෙනු කිරීමේ මාර්ග
XXVIII වන පරිච්ඡේදය පරිපාලන කාර්ය පිරිපාටි හා විධි
XXX වන පරිච්ඡේදය රජයේ නිලධරයන් සම්බන්ධයෙන් ආණ්ඩුව සතු බලතල
XXXIII වන පරිච්ඡේදය නීති උපදෙස් හා නීති ක්‍රියා මාර්ග
XLVII වන පරිච්ඡේදය සාමාන්‍ය හැසිරීම හා විනය
XLVIII වන පරිච්ඡේදය විනය කාර්ය පරිපාටිය පිළිබඳ රීති

මුදල් රෙගුලාසි (විෂය අංකය - 04) - විෂය නිර්දේශය

මෙම ප්‍රශ්න පත්‍රය මුදල් රෙගුලාසිවල පහත සඳහන් පරිච්ඡේද මත සැකසේ.

(i) VI වන පරිච්ඡේදය
ආණ්ඩුවේ මුදල් යනාදියේ භාරකාරිත්වය, අග්‍රිමය හා බැංකු ගිණුම්, උප පත්‍රිකා පොත්, මුදල්, මුද්දර යනාදිය පිළිබඳ සමීක්ෂණ මණ්ඩල, අග්‍රිම, බැංකු ගිණුම් (මු.රෙ. 315 සිට 396 දක්වා)

(ii) x111 වන පරිච්ඡේදය
සැපයුම්, වැඩ හා සේවා
ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත්තු, සැපයුම්, භාණ්ඩවල භාරය සහ හරි වැරිදි බැලීම, වැඩිමනත් භාණ්ඩ සහ පාවිච්චි කළ නොහැකි භාණ්ඩ (මු. රෙ. 685 සිට 775 දක්වා)

09. මෙම විභාග නිවේදනයේ විධිවිධාන සලසා නොමැති කවර කරුණක් පිළිබඳව වුව ද රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වන්නේය.

11. අයදුම්කරුවකුට විභාග ප්‍රවේශපත්‍රයක් නිකුත්කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

11. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවයක් ඇති බව පෙනී යන්නේ නම්, එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනය අනුව කටයුතු කරනු ලැබේ.

ජේ. ජේ. රත්නසිරි,
ලේකම්,
රාජ්‍ය සේවා පළාත් සභා හා පළාත් පාලන
අමාත්‍යාංශය.

2020 දෙසැම්බර් මස 22 වැනි දින,
රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරස්‍රය,
කොළඹ 07.

**ආදර්ශ අයදුම්පත**

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

**ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ II ශ්‍රේණියේ නිලධරයන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2018 (I)) 2021**
EFFICIENCY BAR EXAMINATION PRESCRIBED FOR OFFICERS IN GRADE II OF
SRI LANKA TECHNOLOGICAL SERVICE – 2018 (I) 2021

**(එක් නිලධරයකුට III ශ්‍රේණිය සහ II ශ්‍රේණිය යන විභාග දෙක සඳහාම එකවර අයදුම්පත් ඉදිරිපත් කළ නොහැක.)**

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :

සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

01. ඔබ සේවයට බඳවා ගෙන ඇත්තේ මධ්‍යම රජය යටතේ ද ? නැතහොත් කුමන පළාත් රාජ්‍ය සේවය යටතේ ද ?

අදළ අංකය කොටුව තුළ සඳහන් කරන්න

| රාජ්‍ය සේවය | අංකය |
|---|---|
| මධ්‍යම රජය | 10 |
| බස්නාහිර පළාත් | 01 |
| මධ්‍යම පළාත් | 02 |
| දකුණු පළාත් | 03 |
| උතුරු පළාත් | 04 |

| රාජ්‍ය සේවය | අංකය |
|---|---|
| නැගෙනහිර පළාත් | 05 |
| වයඹ පළාත් | 06 |
| උතුරුමැද පළාත් | 07 |
| ඌව පළාත් | 08 |
| සබරගමුව පළාත් | 09 |

02. (අ) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(උදා : HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

(ආ) අගට යෙදෙන නම මුලින්ද අනෙකුත් නම්වල මුලකුරු පසුවද යොදා නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :
(උදා : GUNAWARDHANA, H.M.S.K.)

(ඇ) සම්පූර්ණ නම (සිංහලෙන්/ දෙමළෙන්) :————.

03. රාජකාරි ලිපිනය (මෙම ලිපිනයට විභාග ප්‍රවේශපත්‍ර තැපැල් කරනු ලැබේ.)

(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

(සිංහලෙන්/ දෙමළෙන්) :————.

04. ස්ත්‍රී/ පුරුෂ භාවය ඃ

පුරුෂ - 0 ☐

ස්ත්‍රී - 1 (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

05. ජාතික හැඳුනුම්පත් අංකය ඃ ☐☐☐☐☐☐☐☐☐☐☐☐

06. ජංගම දුරකථන අංකය ඃ ☐☐☐☐☐☐☐☐☐☐

07. ඉදිරිපත් වන විෂයය/විෂයයන් ඃ

| විෂයය | විෂය අංකය |
|---|---|
| ................................ | ☐ |
| ................................ | ☐ |

08. (i) උපන් දිනය ඃ

වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

(ii) 2021.02.08 දිනට වයස ඃ

අවු ☐☐ මාස ☐☐ දින ☐☐

09. (i) පදවි නාමය :————.

(ii) 2021.02.08 වැනි දිනට II ශ්‍රේණියේ සේවා කාලය :————.

10. ඔබ අයත්වන දෙපාර්තමේන්තුව :————.

11. විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර :————.

(i) විභාග ගාස්තු ගෙවූ තැපැල් කාර්යාලය/ උප තැපැල් කාර්යාලය :————.

(ii) ලදුපත් අංකය හා දිනය :————.

(iii) ගෙවූ මුදල :————.

| |
|---|
| ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න. (ලදුපතේ පිටපතක් ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් විය හැක.) |

ඉහත සඳහන් විස්තර නිවැරදි බවත්, ඉල්ලා ඇති භාෂා මාධ්‍යයෙන් මෙම විභාගයට පෙනී සිටීමට හිමිකම් ඇති බවත් ප්‍රකාශ කරමි. තව ද විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට යටත් වන බව ද ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරු/අයදුම්කාරියගේ අත්සන

දිනය :————.

**අත්සන සහතික කිරීම**

මාගේ කාර්යාලයේ නිලධාරියකු/නිලධාරිනියක සහ මා පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන....................................... මහතා/මහත්මිය/මෙනෙවිය...................දින මා ඉදිරිපිට දී අත්සන් කළ බවත්, නියමිත විභාග ගාස්තුවෙන් නිදහස් බවත්/ නියමිත විභාග ගාස්තුව ගෙවා එම ලදුපත අලවා ඇති බවත් සහතික කරමි.

————,
සහතික කරන නිලධාරියාගේ අත්සන.

දිනය :————.

සහතික කරන නිලධාරියාගේ නම :————.
තනතුර :————.
ලිපිනය :————.
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

**දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය**

ඉහත අංක 01 සිට 11 තෙක් අඩංගු තොරතුරු නිවැරදි බවත් මෙම අයදුම්කරුට/ අයදුම්කාරියට මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ඇති බවත්, ඔහු/ඇය විසින් දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් මෙම විභාගයට පෙනී සිටීමට ඔහුට/ඇයට සුදුසුකම් ඇති බවත් සහතික කරමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන හා පදවි නාමය

දිනය :————.

(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

01 - 75/1

---

## ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ III ශ්‍රේණියේ නිලධරයන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2018 (I)(2021)

ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ අනුමත සේවා ව්‍යවස්ථාවට අනුකූලව යථෝක්ත විභාගය, විභාග කොමසාරිස් ජනරාල් විසින් 2021 අප්‍රේල් මස කොළඹ දී පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

01. (i) මෙම විභාගය, විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන අතර, විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ඔහු විසින් නියම කරන ලද නීති රීතිවලට විභාග අයදුම්කරුවන් යටත් වේ. මෙම නීති රීති උල්ලංඝනය කළහොත්, විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට ඔවුනට සිදුවෙනවා ඇත.

(ii) අයදුම්කරුවන් සඳහා පනවා ඇති නීති, *ගැසට් නිවේදනයේ* මුල වෙනම මුද්‍රණය කර ඇත.

03. මෙම විභාග සඳහා ඉල්ලුම් කිරීමේ ආදර්ශ අයදුම් පත්‍රය මෙම නිවේදනයේ අවසානයේ පළ කර ඇත. එම ආදර්ශ අයදුම් පත්‍රය අනුව අයදුම්කරුවන් ස්වකීය අයදුම් පත්‍රය පිළියෙල කර ගත යුතු අතර, ඒ අනුව ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ මධ්‍යම රාජ්‍ය සේවයේ නිලධරයකු නම්, තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මාර්ගයෙන් ද, ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ පළාත් රාජ්‍ය සේවයේ නිලධරයෙකු නම්, ඔවුන් සේවය කරන පළාත් සභාවේ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් මගින් ද, 2021.02.08 දින හෝ ඊට පෙර ලැබෙන සේ, ''විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන (ආයතනික හා විදේශ විභාග) ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ. පෙ. 1503, කොළඹ'' යන ලිපිනය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවන කවරයේ වමත් පස ඉහළ කෙළවරේ '' ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ III ශ්‍රේණියේ නිලධරයන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2018(I) (2021) '' ලෙස සඳහන් කළ යුතු ය. අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

03. *අනන්‍යතාව :*

විභාග අපේක්ෂක/අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාවය සනාථ කළ යුතු ය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

(*අ*) ජාතික හැඳුනුම්පත්‍ර.

(*ආ*) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

(*ඇ*) වලංගු ශ්‍රී ලංකික රියදුරු බලපත්‍රය.

එමෙන්ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාවය තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතු ය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාල ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරීන් අයදුම්කරු හඳුනාගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතු ය.

04. *අයදුම්පත්‍රය :*

(i) අදාර්ශ අයදුම්පතට අනුකූලව "ඒ 4" ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්ත භාවිතා කරමින් අයදුම්පත්‍රය පිළියෙල කළ යුතුය. අංක 01 සිට 06 තෙක් පළමුවන පිටුවට ද ඉතිරිය අනෙක් පිටුවලට ද ඇතුළත් විය යුතුය. අයදුම්පත්‍රය යතුරු ලියනය කර පිළියෙල කරගත හැකි වුව ද, එය නිවැරදිව හා පැහැදිලිව අයදුම්කරුගේ අත් අකුරින් ම පිරවිය යුතුය. අයදුම්කරුවන් මෙම විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යයෙන් අයදුම්පත පිරවිය යුතුය.

(ii) අයදුම්පත්‍රය පිළියෙල කරගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම, සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන් ද, දෙමළ මාධ්‍ය අයදුම්පත්‍රවල දෙමළ භාෂාවට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන් ද යෙදිය යුතුය. ආදර්ශ අයදුම්පතට අනුකූල නොවන අයදුම්පත් හා අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්කරු විසින් සම්පූර්ණ කරන ලද අයදුම්පත විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පතට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් ම විමසා බැලිය යුතු අතර, එම අයදුම්පතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

(iii) පළමුවන වරට මෙම විභාගයේ එක් විෂයයකට හෝ විෂයයන් දෙකටම අයදුම්කරන නිලධරයන් විසින් කිසිදු විභාග ගාස්තුවක් ගෙවිය යුතු නොවේ. එසේ වුවත් ඉන්පසු වාරවල දී නිලධරයන් විභාගයට අයදුම් කරන්නේ නම් සම්පූර්ණ විභාගය සඳහා රු. 500 ක විභාග ගාස්තුවක් ද, එක් විෂයයක් සඳහා පෙනී සිටින්නේ නම් රු. 250 ක විභාග ගාස්තුවක් ද, ගෙවිය යුතුය. විභාග ගාස්තුව අයදුම්පත් භාරගන්නා අවසන් දින හෝ ඊට පෙර විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 20-03-02-13ට බැර වන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම තැපැල් කාර්යාලයකට හෝ උපතැපැල් කාර්යාලයකට හෝ ගෙවා ලබාගන්නා ලදුපත අයදුම්පතේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ ඇලවිය යුතුය. මෙම ලදුපතේ ඡායා පිටපතක් අයදුම්කරු ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. කවර හේතුවක් යටතේ වුව ද මෙම ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ. මෙම විභාගය සඳහා ගෙවනු ලබන ගාස්තුව වෙනත් කිසිදු විභාගයකට මාරු කිරීමට ද ඉඩදෙනු නොලැබේ.

(iv) මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පැවැත්වේ. අයදුම්කරුවෙකු තමාට අදාළ එක් මාධ්‍යයක් තෝරා ගත යුතු අතර, විභාගයට නියමිත සියලුම ප්‍රශ්නපත්‍ර සඳහා එම මාධ්‍යයෙන්ම පිළිතුරු සැපයිය යුතුය. අයදුම් කරන ලද භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

(v) අයදුම්පත් භාරගන්නා අවසන් දින වන විට ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ III ශ්‍රේණියට බඳවා ගත් නිලධරයන්ට පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගයට පෙනී සිටිය හැකිය.

(vi) ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ III ශ්‍රේණියේ නිලධරයන්ට පෙනී සිටිය හැක්කේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගයට පමණක් වන අතර, ඔවුන්ට දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගයට පෙනී සිටිය නොහැක.

05. (i) ගැසට් නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත, අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර විභාග ගාස්තු ගෙවා ඊට අදාළ ලදුපත සමග විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය, අයදුම් කරන විභාගය, අයදුම්කරුගේ අත්සන හා අත්සන සහතික කිරීම ද, දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය ද සහිතව නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශපත්‍ර නිකුත්කරනු ඇත. අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත්කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළකරනු ඇත.

නිවේදනය පළ වී දින 2ක් හෝ 3ක් හෝ ගත වූ පසුවත් ප්‍රවේශපත්‍රය නොලැබුණි නම්, දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුය. එහිදී අයදුම්කරුගේ සම්පූර්ණ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා විභාගයේ නම සඳහන් කළ යුතු අතර, එසේ විමසන අවස්ථාවේ අයදුම්කරු විසින් ළඟ තබා ගත් අයදුම්පත්‍රයේ පිටපත, විභාග ගාස්තු ගෙවීම අදාළ නම් ලදුපතේ පිටපත හා අයදුම්පත තැපැල් කිරීමේ දී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය අතැතිව සිටීම වැදගත් වේ. කොළඹින් බැහැර අයදුම්කරුවෙකු නම් ෆැක්ස් මගින් ප්‍රවේශපත්‍රයේ පිටපතක් ලබාගැනීම සඳහා අයදුම්කරුගේ ෆැක්ස් අංකයක් හා ඉහත දක්වා ඇති තොරතුරු ද සඳහන් කරන ලද ඉල්ලීම් ලිපියක් ෆැක්ස් මගින් විභාග දෙපාර්තමේන්තුව වෙත යොමු කරමින් විමසා සිටීම ද ප්‍රතිඵලදායී වනු ඇත.

ඉහත අවශ්‍යතාවන් සපුරාලීමට අපොහොසත් වන අයදුම්කරුවන් විසින් පසුව ඉදිරිපත් කෙරෙන ලියවිලි සලකා බලනු නොලැබේ.

(ii) විභාගය සඳහා වන ප්‍රවේශපත්‍රයේ අයදුම්කරුගේ අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරයෙකු ලවා සහතික කරවා ගත යුතු ය. විභාගයට පෙනී සිටින නිලධරයන් විසින් විභාග ශාලාධිපති වෙත ඔවුන්ගේ අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍ර පමණක් ඉදිරිපත් කළ යුතු ය. එවැනි ප්‍රවේශ පත්‍රයක් නොමැතිව විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබ්.

06. පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත්වීමට අදළ නියමිත කාලය තුළ තම අභිමතය පරිදි, එක් එක් විෂයය සඳහා වෙන් වෙන් වශයෙන් හා එකිනෙකට වෙනස් වූ වාරවලදී පෙනී සිටීමට නිලධරයන්ට හැකිවේ. එතෙකුදු වුවත් සාමාර්ථ්‍යයක් සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රයකින් අවම වශයෙන් 40% ක ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතුය.

07. විභාග ප්‍රතිඵල නිකුත් කිරීම :

පළාත් රාජ්‍ය සේවායේ නිලධරයන්ගේ ප්‍රතිඵල අදාළ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ද, මධ්‍යම රාජ්‍ය සේවයේ නිලධරයන්ගේ ප්‍රතිඵල රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් වෙත ද නිකුත් කිරීමට කටයුතු කරනු ලැබේ.

08. *විභාග පටිපාටිය* :

(1) III ශ්‍රේණියේ නිලධරයන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය පහත සඳහන් ප්‍රශ්න පත්‍ර 02න් සමන්විත වේ.

විෂය අංකය (01)- ආයතන සංග්‍රහය හා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති (කාලය පැය 02 කි) ලකුණු 100 යි

විෂය අංකය (02) - මුදල් රෙගුලාසි - (කාලය පැය 02 කි) ලකුණු 100 යි.

**ආයතන සංග්‍රහය හා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති (විෂය අංකය - 01) - විෂය නිර්දේශය**

මෙම ප්‍රශ්න පත්‍රය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති සහ ආයතන සංග්‍රහයේ පහත සඳහන් පරිච්ඡේද මත සැකසේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති -

| | |
|---|---|
| VIII වන පරිච්ඡේදය | අතිකාල දීමනා, නිවාඩු දහස් හා නිවාඩු දවස් සඳහා වැටුප හා දීමනා |
| XII වන පරිච්ඡේදය | නිවාඩු |
| XIII වන පරිච්ඡේදය | දුම්රිය බලපත්‍ර |
| XIV වන පරිච්ඡේදය | දිවයින ඇතුළත රාජකාරී ගමන් |
| XIX වන පරිච්ඡේදය | රජයේ නිවාස |

**මුදල් රෙගුලාසි (විෂය අංකය - 02) - විෂය නිර්දේශය**

මෙම ප්‍රශ්න පත්‍රය මුදල් රෙගුලාසිවල පහත සඳහන් පරිච්ඡේද මත සැකසේ.

(i) I වන පරිච්ඡේදය
වියදම් හා ආදායම් ඇස්තමේන්තු
ඒකාබද්ධ අරමුදල සහ වියදම් සැලසුම් කිරීම හා වැඩ සටහන්ගත කිරීම, වාර්ෂික වියදම් ඇස්තමේන්තු ඉදිරිපත් කිරීමේ ස්වරූපය, නව යෝජනා, වියදම් ඇස්තමේන්තු පිළියෙල කිරීමේ වගකීම, වියදම් ඇස්තමේන්තුවල වෙනස් කිරීම (මු.රෙ. 1 සිට 68 දක්වා).

(ii) 111 වන පරිච්ඡේදය
මූල්‍ය කළමනාකරණ හා උත්තරාදායී බව
ප්‍රධාන ගණන් නිලධාරීන්, ගණන් නිලධාරීන්, ආදයම් ගිණුම් නිලධාරීන් ගෙවීම් සඳහා බලය ලබාදීම, අනුමත කිරීම, සහතික කිරීම, කාර්යය පැවරීම. (මු. රෙ. 124 සිට 147 දක්වා)

09. මෙම විභාග නිවේදනයේ විධිවිධාන සලසා නොමැති කවර කරුණක් පිළිබඳව වුව ද රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වන්නේ ය.

10. අයදුම්කරුවකුට විභාග ප්‍රවේශපත්‍රයක් නිකුත්කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

11. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවයක් ඇති බව පෙනී යන්නේ නම්, එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනය බලාත්මක වන්නේ ය.

ජේ. ජේ. රත්නසිරි,
ලේකම්,
රාජ්‍ය සේවා, පළාත් පාලන සභා හා
පළාත් පාලන අමාත්‍යාංශය.

2020 දෙසැම්බර් මස 22 වැනි දින,
රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

ආදර්ශ අයදුම්පත්‍රය

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

**ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ III ශ්‍රේණියේ නිලධරයන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2018 (I)) 2021**

EFFICIENCY BAR EXAMINATION PRESCRIBED FOR OFFICERS IN GRADE III OF SRI LANKA TECHNOLOGICAL SERVICE – 2018 (I) 2021

(එක් නිලධරයකුට III ශ්‍රේණිය සහ II ශ්‍රේණිය යන විභාග දෙක සඳහාම එකවර අයදුම්පත් ඉදිරිපත් කළ නොහැක.)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :

සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

01. ඔබ සේවයට බඳවා ගෙන ඇත්තේ මධ්‍යම රජය යටතේ ද ? නැතහොත් කුමන පළාත් රාජ්‍ය සේවය යටතේ ද ?

අදළ අංකය කොටුව තුළ සඳහන් කරන්න.

| රාජ්‍ය සේවය | අංකය |
|---|---|
| මධ්‍යම රජය | 10 |
| බස්නාහිර පළාත් | 01 |
| මධ්‍යම පළාත් | 02 |
| දකුණු පළාත් | 03 |
| උතුරු පළාත් | 04 |

| රාජ්‍ය සේවය | අංකය |
|---|---|
| නැගෙනහිර පළාත් | 05 |
| වයඹ පළාත් | 06 |
| උතුරුමැද පළාත් | 07 |
| ඌව පළාත් | 08 |
| සබරගමුව පළාත් | 09 |

02. (අ) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(උදා : HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)
(ආ) අගට යෙදෙන නම මුලින්ද අනෙකුත් නම්වල මුලකුරු පසුවද යොදා නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :
(උදා : GUNAWARDHANA, H.M.S.K.)
(ඇ) සම්පූර්ණ නම (සිංහලෙන්/ දෙමළෙන්) :————.

03. රාජකාරි ලිපිනය (මෙම ලිපිනයට විභාග ප්‍රවේශපත්‍ර තැපැල් කරනු ලැබේ.)

:————. (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

:————. (සිංහලෙන්/ දෙමළෙන්)

04. ස්ත්‍රී/ පුරුෂ භාවය :

පුරුෂ - 0
ස්ත්‍රී - 1 (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

05. ජාතික හැඳුනුම්පත් අංකය :

06. ජංගම දුරකථන අංකය :

07. ඉදිරිපත් වන විෂයය/විෂයයන් :

| විෂයය | විෂය අංකය |
| --- | --- |
| ................................ | |
| ................................ | |

08. (i) උපන් දිනය :

වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

(ii) 2021.02.08 දිනට වයස :

අවු ☐☐ මාස ☐☐ දින ☐☐

09. (i) පදවි නාමය :————.

(ii) 2021.02.08 වැනි දිනට III ශ්‍රේණියේ සේවා කාලය :————.

10. ඔබ අයත්වන දෙපාර්තමේන්තුව :————.

11. විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර :————.
   (i) විභාග ගාස්තු ගෙවූ තැපැල් කාර්යාලය :————.
   (ii) ලදුපත් අංකය හා දිනය :————.
   (iii) ගෙවූ මුදල :————.

| ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න. (ලදුපතේ පිටපතක් ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් විය හැක.) |
| --- |

ඉහත සඳහන් විස්තර නිවැරදි බවත්, ඉල්ලා ඇති භාෂා මාධ්‍යයෙන් මෙම විභාගයට පෙනී සිටීමට හිමිකම් ඇති බවත් ප්‍රකාශ කරමි. තව ද විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට යටත් වන බව ද ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරු/අයදුම්කාරියගේ අත්සන.

දිනය :————.

**අත්සන සහතික කිරීම**

මාගේ කාර්යාලයේ නිලධාරියකු/නිලධාරිනියක සහ මා පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන........................................ මහතා/මහත්මිය/මෙනෙවිය....................දින මා ඉදිරිපිට දී අත්සන් කළ බවත්, නියමිත විභාග ගාස්තුවෙන් නිදහස් බවත්/ නියමිත විභාග ගාස්තුව ගෙවා එම ලදුපත අලවා ඇති බවත් සහතික කරමි.

————,
සහතික කරන නිලධාරියාගේ අත්සන.

දිනය :————.
සහතික කරන නිලධාරියාගේ නම :————.
තනතුර :————.
ලිපිනය :————.
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

**දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය**

ඉහත අංක 01 සිට 11 තෙක් අඩංගු තොරතුරු නිවැරදි බවත් මෙම අයදුම්කරුට/ අයදුම්කාරියට මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ඇති බවත්, ඔහු/ඇය විසින් දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් මෙම විභාගයට පෙනී සිටීමට ඔහුට/ඇයට සුදුසුකම් ඇති බවත් සහතික කරමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන හා පදවි නාමය
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න).

දිනය :————.

01 - 75/2

## ආගමන හා විගමන දෙපාර්තමේන්තුව

### ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ බලයලත් නිලධාරි II ශ්‍රේණියේ නිලධාරින් සඳහා වූ පළමු වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2018 (2021)

01. ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ බලයලත් නිලධාරින් සඳහා අදාළ අනුමත බඳවා ගැනීම් පරිපාටියේ විධිවිධානයන්ට අනුකූලව බලයලත් නිලධාරීන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් **2021 මැයි** මාසයේ දී **කොළඹ දී** පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. (i) විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විභාග කොමසාරිස් ජනරාල් විසින් නියම කරන ලද නීතිරීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. විභාගය පැවැත්වීම සහ ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසන් තීරණය වනු ඇත.

(ii) විභාග අපේක්ෂකයන් සඳහා පනවා ඇති නීති *ගැසට් නිවේදනයේ* වෙනම මුද්‍රණය කර ඇත. මෙම නීති උල්ලංඝනය කළහොත්, විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔවුනට සිදු වනවා ඇත.

03. *විභාග ගාස්තු* : විභාගයට නියමිත විෂයයන් සඳහා එකවර හෝ වෙන වෙනම හෝ පෙනී සිටිය හැකි ය. සම්පූර්ණ විභාගයට හෝ එක් විෂයකට පළමුවරට පෙනී සිටින අපේක්ෂකයින්ගෙන් ගාස්තු අය නොකෙරේ. ඉන් පසු පෙනී සිටින ඕනෑම වාරයකදී එක් විෂයයක් සඳහා රු. 250 ක විභාග ගාස්තුවක් ද, සම්පූර්ණ විභාගය සඳහා රු. 500 ක විභාග ගාස්තුවක් ද අය කෙරේ. මෙම විභාග ගාස්තු විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 20-03-02-13 ට බැර වන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම තැපැල්/ උප තැපැල් කාර්යාලයකට ගෙවා ලබා ගන්නා ලදුපත අයදුම්පතේ නියමිත ස්ථානයේ නොගැලවනසේ ඇලවිය යුතු ය. (ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.) විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව මොනම හේතුවක් නිසාවත් ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ නොකරනු ලැබේ.

04. *අයදුම්පත් :*

අයදුම්පත මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු අතර, එම ආදර්ශ අයදුම්පත අනුව A4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්ත භාවිත කරමින් පිළියෙල කළ යුතුය. ශීර්ෂ අංක 01 සිට 06 තෙක් පළමුවන පිටුවටත්, ඉතිරිය දෙවන පිටුවටත් ලෙස ගෙන සකස් කළ යුතු ය. අයදුම්පත පිළියෙල කර ගන්නා විට ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්වල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්වල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද, යෙදීම අවශ්‍ය ය. අයදුම්පත යතුරුලියනය කර පිළියෙල කර ගතහැකි වුව ද, එය නිවැරදිව හා පැහැදිළිව අයදුම්කරුගේ අත්අකුරින්ම සම්පූර්ණ කළ යුතු ය. ඒ අනුව පිළියෙල කරන ලද අයදුම්පත්, අපේක්ෂකයින් විසින් දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් **2021.02.15** වැනි දිනට පෙර ලැබෙන සේ "විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන (ආයතනික හා විදේශ විභාග) ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ. පෙ. 1503, කොළඹ." යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. අයදුම්පත් එවීමේදී ලියුම් කවරයේ වමත් පස ඉහළ කෙළවරේ විභාගයේ නම සඳහන් කළ යුතු ය. අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත් හා බාරගැනීමේ අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ඇත. තව ද, සම්පූර්ණ කරන ලද අයදුම්පත විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පතට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු අතර, එසේ නොවුවහොත්, අයදුම්පත ප්‍රතික්ෂේප වනු ඇත. (සම්පූර්ණ කරන ලද අයදුම්පතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)

05. විභාග අපේක්ෂක / අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළදී තමන් පෙනී සිටින සෑම විෂයක් සඳහා ම ශාලාධිපති සෑහීමකට පත් වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

(i) ජාතික හැඳුනුම්පත,
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය,
(iii) වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

එමෙන්ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තවද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිට වන තෙක් විභාග බලධාරීන්ට අයදුම්කරු හඳුනා ගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

06. *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් යොමු කර ඇති අපේක්ෂකයින් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග කාලසටහනේ පිටපතක් සමඟ ප්‍රවේශ පත්‍ර නිකුත්

කරනවා ඇත. අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මඟින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 02 ක් හෝ 03 ක් ගතවූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලද අයදුම්කරුවකු වේ නම්, නිවේදනයේ සඳහන් දුරකථන අංක ඔස්සේ ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දැන්විය යුතු ය. එහිදී අයදුම්කරුගේ සම්පූර්ණ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය, හා විභාගයේ නම සඳහන් කළ යුතු අතර එසේ විමසන අවස්ථාවේ අයදුම්කරු විසින් ළඟ තබා ගත් අයදුම්පතේ පිටපත, මුදල් ගෙවීමෙන් ලද කුවිතාන්සියේ පිටපත හා අයදුම්පත තැපැල් කිරීමේදී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය අතැතිව සිටීම වැදගත් වේ. කොළඹින් බැහැර අයදුම්කරුවකු වේ නම් ෆැක්ස් මඟින් ප්‍රවේශ පත්‍රයේ පිටපතක් ලබා ගැනීම සඳහා ඔබගේ ෆැක්ස් අංකයක් හා ඉහත දක්වා ඇති තොරතුරු ද සඳහන් කරන ලද ඉල්ලීම් ලිපියක් ෆැක්ස් මඟින් විභාග දෙපාර්තමේන්තුව වෙත යොමු කර විමසා සිටීම ද ප්‍රතිඵලදායි වනු ඇත.

07. අයදුම්පතේ ද විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ ද, අයදුම්කරුගේ අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා සහතික කර තිබිය යුතු ය. අපේක්ෂකයකු තමාට නියම කර ඇති විභාග ශාලාවේ දී නියමිත විභාග අංකය යටතේ විභාගයට පෙනී සිටිය යුතු අතර, විභාග දින තම ප්‍රවේශ පත්‍රයේ නිශ්චිතව සඳහන් නිලධාරියකුගෙන් අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය ශාලාධිපති වෙත භාරදිය යුතුය. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

08. විභාගයට ඉල්ලුම් කරන අවස්ථාව වන විට පැවති අයදුම්කරුවකුගේ තනතුර සහ සේවා ස්ථානය, විභාගය සම්බන්ධ සියලු කටයුතු සඳහා අදාළ වන අතර, අයදුම්පත් එවීමෙන් පසුව ඒ සම්බන්ධව සිදුවන වෙනස්වීම් කිසිවක් පිළිබඳව සලකනු නොලැබේ.

09. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විභාග කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද ප්‍රවේශ පත්‍ර ඇති අයදුම්කරුවන්ට විභාගයට පෙනී සිටීමට හැකි වන පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් රාජකාරී නිවාඩු දිය යුතු ය. මේ සඳහා ගමන් ගාස්තු ගෙවනු නොලැබේ.

10. මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසිමාධ්‍ය වලින් පැවැත්වේ. අපේක්ෂකයකු විභාගයට පෙනීසිටීම සඳහා භාෂා මාධ්‍ය ලෙස, තරග විභාගයක් මඟින් රාජ්‍ය සේවයට බැඳුණු අයකු නම්, තරග විභාගයට පෙනී සිටින ලද භාෂා මාධ්‍ය ද තරග විභාගයකින් තොරව රාජ්‍ය සේවයට බැඳුණු අයකු නම්, රාජ්‍ය සේවයට ඇතුළත් වීමට සුදුසුකම් ලැබූ විභාගයට පෙනී සිටින ලද භාෂා මාධ්‍ය ද වශයෙන් තෝරා ගත යුතු ය. විභාගයට නියමිත සියළු ම විෂයන් සඳහා එකම භාෂා මාධ්‍යයකින් පෙනී සිටිය යුතු අතර ඉල්ලුම් කරන ලද භාෂා මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

11. *විභාග පටිපාටිය* :

1. විභාගයේ නම : ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ බලයලත් නිලධාරී II වන ශ්‍රේණිය I වන කාර්යක්ෂමතා කඩඉම

2. *විභාගය පිළිබඳ විස්තර :*

| *ප්‍රශ්න පත්‍රය* | | *කාලය* | *මුළු ලකුණු* | *සමත් ලකුණ* |
|---|---|---|---|---|
| 01 වන ප්‍රශ්න පත්‍රය | ආගාමික හා විගාමික ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන I | පැය 02 | 100 | 40% |
| 02 වන ප්‍රශ්න පත්‍රය | ආගාමික හා විගාමික ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන II | පැය 02 | 100 | 40% |
| 03 වන ප්‍රශ්න පත්‍රය | ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි | පැය 02 | 100 | 40% |

3. විභාගය පවත්වනු ලබන බලධරයා :
විභාග කොමසාරිස් ජනරාල්

4. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක් ද යන වග : වසරකට අවම වශයෙන් දෙවරක්.

5. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* |
|---|---|
| 01 වන ප්‍රශ්න පත්‍රය - ආගාමික හා විගාමික ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන I | 1. 1948 අංක 20 දරන ආගාමික හා විගාමික පනත හා එහි සංශෝධන<br>2. 1948 අංක 18 දරන පුරවැසිභාවය පිළිබඳ පනත හා එහි සංශෝධන<br>3. 2008 අංක 38 දරන චීන සම්භවයක් ඇති තැනැත්තන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ (විශේෂ විධිවිධාන) පනත<br>4. 1967 අංක 14 දරන ඉන්දු ලංකා ගිවිසුම ක්‍රියාත්මක කිරීමේ පනත<br>5. සංචරණය සඳහා විද්‍යුත් අනුමැතිය ලබාදීමේ ක්‍රමවේදය (ETA) හා ඒ යටතේ පනවන ලද ව්‍යවස්ථා රෙගුලාසි |
| 02 වන ප්‍රශ්න පත්‍රය - ආගාමික හා විගාමික ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන II | 1. 1968 අංක 32 දරන පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ පනත හා එහි සංශෝධන<br>2. 1977 අංක 08 දරන උද්ඊපන නීතිය හා එහි සංශෝධන<br>3. ඉන්දියානු හා පකිස්ථානු වැසියන් ලියාපදිංචි කිරීමේ පනත<br>4. මෙම පනත්වල පසුකාලීන සංශෝධන හා ඒ යටතේ පනවන ලද රෙගුලාසි<br>5. අපරාධ නඩු විධාන සංග්‍රහයේ V වන කොටසේ XI, XII, XIII, XIV, XV. රාජකාරි වලට අදාල වන පරිච්ඡේද<br>6. ආගමික හා විගාමික පනත යටතේ ප්‍රායෝගික ගැටලු |
| 03 වන ප්‍රශ්න පත්‍රය - ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි | 1. ආයතන සංග්‍රහයේ II, IV, VII, XII, XIII, XIV, XLVII, XLVIII පරිච්ඡේද<br>2. අංක 1589/30 හා 2009.02.20 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති<br>3. මුදල් රෙගුලාසි සංග්‍රහයේ මු.රෙ.2(1),135, 136, 137, 138, 139 මු.රෙ. IV, VI පරිච්ඡේද |

*සටහන :*

ඉහත විෂයන්ට එක වරම හෝ වෙන වෙනම පෙනී සිටිය හැකිය.

නියමිත කාලය තුළදී විභාගය සමත්වීමට නොහැකිවීම, ඉන්පසුව යෙදෙන වේතනාධිකය විලම්භනය කිරීමට හේතුවේ.

12. අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු ය.

13. මෙම ගැසට් නිවේදනය මගින් විධිවිධාන සලසා නොමැති කවර කරුණක් පිළිබඳව වුවද ආගමන හා විගමන පාලක ජනරාල්ගේ තීරණය අවසාන තීරණය වන්නේ ය.

14. මෙම නිවේදනයේ සිංහල හා දෙමළ අනුවාදයන් අතර කිසියම් අනනුකූලතාවක් පවතී නම්, සිංහල නිවේදනයේ සඳහන් කරුණු බලපැවැත්වේ.

ආගමන හා විගමන පාලක ජනරාල්
ආගමන හා විගමන දෙපාර්තමේන්තුව,
සුහුරු පාය,
බත්තරමුල්ල.

**ආදර්ශ අයදුම්පත**

**ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ බලයලත් නිලධාරී II ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2018 (2021)**

**First Efficiency Bar Examination for Authorized Officers Grade II of the Department of Immigration and Emigration - 2018 (2021)**

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය :

සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

01. 1.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : ..................................................................................
(උදා : HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

1.2 අගට යෙදෙන නම මුලින්ද අනෙකුත් නම් වල මුලකුරු පසුවද යොදා නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්):
..........................................................................................................................................
(උදා : GUNAWARDHANA H. M. S. K.)

1.3 සම්පූර්ණ නම : ............................................................................................................
(සිංහලෙන්/ දෙමළෙන්)

02. 2.1 කාර්යාලයේ/ දෙපාර්තමේන්තුවේ/ ආයතනයේ නම සහ ලිපිනය : ....................................................... .
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
(ප්‍රවේශ පත්‍රය මෙම ලිපිනයට තැපැල් කරනු ලැබේ.)

2.2 කාර්යාලයේ/ දෙපාර්තමේන්තුවේ/ ආයතනයේ නම සහ ලිපිනය : ....................................................... .
(සිංහලෙන්/ දෙමළෙන්)

2.3 පෞද්ගලික ලිපිනය : ....................................................... .
(සිංහලෙන්/ දෙමළෙන්)

03. ස්ත්‍රී/ පුරුෂ භාවය :
පුරුෂ - 0
ස්ත්‍රී - 1
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

04. ජාතික හැඳුනුම්පත් අංකය

05. ජංගම දුරකථන අංකය

06. ඔබ මෙවර විභාගයේදී ඉදිරිපත් වන විෂය/ විෂයයන් ඃ

| අනු අංකය | විෂය | විෂය අංකය |
|---|---|---|
| | | |
| | | |
| | | |

07. උපන් දිනය ඃ

වර්ෂය [ ] මාසය [ ] දිනය [ ]

08. දැනට දරන තනතුර ඃ
8.1 තනතුර ඃ ...................................................................................
8.2 පත්වීම් ලිපියේ අංකය ඃ ..............................................................

09. 9.1 ඔබ විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට ද ? ..................................................................
9.2 විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට නොවේ නම් ගෙවන ලද විභාග ගාස්තුව ඃ ................
9.3 ලදුපත් අංකය ඃ ...............................
9.4 දිනය ඃ ............................................

ලදුපත මෙහි අලවන්න (අදාළ නම් පමණි)
ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත)

10. ඉහත සඳහන් විස්තර නිවැරදි බවත්, ඉහත දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් විභාගයට පෙනී සිටීමට හිමිකම් ඇති බවත්, විභාග ගාස්තුව රුපියල් ...................................... ගෙවා ලබා ගත් ලදුපත මෙහි අලවා ඇති බවත් ප්‍රකාශ කරමි. තව ද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම එකඟ වන බවද ප්‍රකාශ කරමි.

..................................................................
අපේක්ෂකයාගේ/ අපේක්ෂිකාවගේ අත්සන

දිනය ඃ ...............................

තම දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ එම දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙනුවට අත්සන් කිරීමට බලයලත් නිලධාරියකු ඉදිරිපිටදී අයදුම්කරු විසින් අත්සන් කළ යුතු ය.

11. අත්සන සහතික කිරීම

මගේ දෙපාර්තමේන්තුවේ බලයලත් නිලධාරියකු /නිලධාරිනියක සහ පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන .............................. ........................................................... මයා/ මිය/ මෙනවිය ...................................... දින මා ඉදිරිපිටදී අත්සන් කළ බවත්, නියමිත විභාග ගාස්තුව ගෙවා ලබා ගත් ලදුපත අලවා ඇති බවත් සහතික කරමි.

...................................................................
අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන

නම ඃ ..............................................................
පදවි නාමය ඃ ..................................................
ලිපිනය ඃ ........................................................
දිනය ඃ ...........................................................
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

12. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය ඃ

1. ඉහත සපයා ඇති විස්තර පරීක්ෂා කර බැලූ බවත්,
2. නිලධාරියා/ නිලධාරිනිය මෙම විභාගයට පෙනී සිටීමට සුදුසු බවත්, සහතික කරමි.

.......................................................................
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.
සහ නිල මුද්‍රාව.

01 - 234

---

**අධ්‍යාපන අමාත්‍යාංශය**

**ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ III ශ්‍රේණියට අදාළ සන්ධාන භාෂා (ඉංග්‍රීසි) විභාගය 2020**

**Link Language (English) Examination for Sri Lanka Education Administrative Service - 2020**

අංක 1928/28 හා 2015 අගොස්තු මස 21 දිනැති ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවා ව්‍යවස්ථාවට අනුව ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරීන් සඳහා වූ සන්ධාන භාෂා (ඉංග්‍රීසි) පරීක්ෂණය 2021 අප්‍රේල් මස කොළඹ දී පැවැත්වෙන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

02. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ සෑම නිලධාරියකුම බඳවා ගැනීමේ දින සිට වසර (03) ක් ඇතුළත සන්ධාන භාෂාව වන ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ප්‍රවීණතාව ලබා ගත යුතු ය.

*සටහන 01* ඃ නිලධාරියකු අ.පො.ස. (සා. පෙළ.) විභාගයේ දී ඉංග්‍රීසි විෂයය සඳහා අවම වශයෙන් සම්මාන සාමාර්ථයක් හෝ ඊට ඉහළ සාමාර්ථයක් ලබා තිබේ නම් හෝ ඉංග්‍රීසි මාධ්‍යයෙන් සේවයට බඳවාගත් නිලධාරියෙකු මෙම සන්ධාන භාෂා (ඉංග්‍රීසි) බිභාගය සමත් වීමේ අවශ්‍යතාවෙන් නිදහස් කරනු ලැබේ. සෙසු නිලධාරීන් මෙම විභාගය සමත් විය යුතු ය.

03. මෙම විභාගයට අදාළ විෂය නිර්දේශය හා අනෙකුත් විධිවිධාන අංක 1928/28 දරන 2015 අගෝස්තු මස 21 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කර ඇත. අයදුම්කරුවන්ගේ පහසුව සඳහා එම විෂය නිර්දේශය හා අනෙකුත් විධිවිධාන පහත දක්වා ඇත.

04. විභාග පටිපාටිය - ලිඛිත පරීක්ෂණය

| විෂය අංකය | විෂය | ලකුණු | කාලය (පැය) |
|---|---|---|---|
| 01 | ඉංග්‍රීසි භාෂාව | 100 | 02 |

04. විෂය නිර්දේශය

4.1 **English Grammar**

A suitable level of proficiency on the following forms of grammar in the spoken and the written language is expected from the candidate.

- Tenses and Numbers
- Sentences (Simple/Compound/Complex/ Compound Complex)
- Relative Clauses
- Reported Speech
- Adjectives and Adverbs
- Determiners
- Prepositions

4.2 **Writing Skills**

The Knowledge on the modern formats and styles of writing is tested in this area of study.

- Essay Writing
- Summary writing skills
- Report writing Skills
- Letter writing

4.3 **Reading Skills**

Candidate's ability to Comprehend a printed text, infer meaning and verbally written interpretation is expected.

- Reading and understanding the specific and general meaning of a printed text.
- Reading and Interpretation (Written)

05. සාමාර්ථය ලැබීම සඳහා මෙම විෂයට අපේක්ෂකයකු අවම වශයෙන් 40% හෝ ඊට වැඩි ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතු ය.

5.1. විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන්ගේ ප්‍රතිඵල ඇතුළත් ප්‍රතිඵල ලේඛනය විභාග කොමසාරිස් ජනරාල් විසින් ලේකම්, අධ්‍යාපන ආමාත්‍යාංශය වෙත ලබා දෙනු ඇත. විභාග අයදුම්කරුවන් වෙත පෞද්ගලික ප්‍රතිඵල ලේඛන නිකුත් කිරීම විභාග කොමසාරිස් ජනරාල් විසින් සිදු නොකරනු ඇත.

06. මෙහි දැක්වෙන ආකෘතියට අනුව ඒ4 (A4) ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්ත භාවිතා කරමින් අයදුම්පත්‍රය ශීර්ෂ අංක 01 සිට 04 තෙක් පළමුවන පිටුවට ද ඉතිරිය දෙවන පිටුවට ද වන ලෙස ගෙන සකස් කළ යුතු අතර ඊට අදාළ තොරතුරු තම අත්අකුරින්ම පැහැදිලිව ඇතුළත් කළ යුතු ය. ආදර්ශ අයදුම්පත්‍රය අනුකූල නොවන අයදුම්පත්‍ර සහ අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරන බැවින්, අයදුම්පත්‍ර යොමු කිරීමට ප්‍රථම එය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත අනුකූල ද යන්න හා සියලු තොරතුරු ඇතුළත් කොට නිවැරදිව සම්පූර්ණ කර තිබේද යන්න පිළිබඳවත් නියමිත විභාග ගාස්තුව ගෙවා එහි විස්තර අයදුම්පත ඇතුළත්කොට ලදුපත අමුණා තිබේද යන්න පිළිබඳවත් විමසිලිමත් විය යුතු ය. අයදුම්පතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇති බව දන්වමි. අයදුම්පත පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්වල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදීම අවශ්‍ය බව දන්වමි.

07. විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාගය පවත්වනු ලබන අතර එය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවා ඇති නීති රීති පිළිපැදීමට අයදුම්කරුවන් බැඳී සිටියි. එම නීතිරීති පිළිපැදීමට අයදුම්කරුවන් බැඳී සිටියි. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටතේ වීමට ඔහුට හෝ ඇයට සිදු වේ. විභාග සඳහා වන පොදු නීතිරීති *ගැසට් පත්‍රයේ* වෙනම පළ කොට ඇත. තවද, රටේ පවතින් නිරෝධන නීතිරීතිවලට ද අපේක්ෂකයින් අවනත විය යුතු ය.

08. *ව්‍යාජ තොරතුරු සැපයීම* .- අයදුම්පත්‍රය පිරවීමේ දී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතු ය. මෙම විභාග යේ නීතිරීති අනුව යම් අයදුම්කරුවකු නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ/ ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකි ය.

09. අයදුම්පත් 2021.01.29 වැනි දින හෝ ඊට ප්‍රථම, "විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන ආයතනික් හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ. පෙ. 1503, කොළඹ" ලිපිනයට ලැබෙන පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානියා/ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ මගින් පමණක් ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. විභාගයේ නම කවරයේ වම්පස ඉහළ කෙළවරේ සඳහන් කළ යුතු ය. මෙදිනට පසු එවනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

10. මෙම *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් විභාගය සඳහා අයදුම්කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත ගාස්තු ගෙවා ඊට අදාළ ලදුපත සමග නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. අයුදම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් පුවත්පත් වල ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියේ පළ කරනු ඇත. එම නිවේදනය පළ වී දින 02ක් හෝ 03ක් ඇතුළත තම ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් එම පුවත්පත් නිවේදනයේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතු ය. එසේ දැන්වීමේ දී අයදුම්කරුගේ සම්පූර්ණ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා අයදුම්කළ විභාගයේ නම සඳහන් කළ යුතු ය. කොළඹින් බැහැර අයදුම්කරුවකු නම් එම විස්තර සමග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් එවිය හැකි ෆැක්ස් අංකයක් ද සහිත ඉල්ලීමේ ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය (011 2784232) වෙත යොමු කර විමසීම වඩාත් ඵලදායි වේ. විභාග දෙපාර්තමේන්තුවෙන් විමසන අවස්ථාවේ අවශ්‍ය වුවහොත් අයදුම්කරුගේ අපේක්ෂකත්වය තහවුරු කිරීම සඳහා තමා ළඟ තබාගත් අයදුම්පතේ පිටපත, විභාග ගාස්තු ගෙවීම අදාළ වේ නම් ඒ සඳහා වූ ලදුපතේ පිටපත හා අයදුම්පත තැපැල් කිරීමේ දී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය ද සූදානමින් තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. අයදුම්කරුවෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු ය.

***සටහන 02*** : ඉහත 10 ඡේදයේ සඳහන් කර ඇති අවශ්‍යතාවන් සපුරාලීමට අපොහොසත් වන

11. අයදුම්පතේ ද විභාගය සඳහාවන ප්‍රවේශ පත්‍රයේ ද අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතු ය. තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා සහතික කරවා ගත යුතු ය.

12. අයදුම්කරුවකු තමාට නියම කර ඇති විභාග ශාලාවේ දී නියමිත විභාග අංකය යටතේ විභාගයට පෙනී සිටිය යුතු ය. විභාගයට පෙනී සිටින සෑම අයදුම්කරුවකුම විභාගයේ පළමු වැනි දින තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය ශාලාධිපති වෙත භාරදිය යුතු ය. විධිමත් පරිදි තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අයදුම්කරුවකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

13. විභාග අපේක්ෂක/අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතු ය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

i. ජාතික හැඳුනුම්පත,
ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය,
iii. වලංගු ශ්‍රී ලාංකික රියැදුරු බලපත්‍රය

එමෙන්ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කර ගත හැකිවන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතු ය. එසේ තම අනන්‍යතාවය සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තවද, විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරීන්ට අයදුම්කරු හඳුනාගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරිමෙන් තොරව සිටිය යුතු ය.

14. **විභාග ගාස්තු :**

(*අ*) මෙම විභාගය සඳහා අයකරන ලද ගාස්තු මොනයම් හේතුවක් මත හෝ ආපසු ගෙවනු නොලබන අතර

වෙනත් විභාගයක ගාස්තුවකට මාරු කිරීමට ද ඉඩදෙනු නොලැබේ.

(*ආ*) පළමුවැනි විභාග අවස්ථාව සඳහා ගාස්තු අයකරනු නොලැබේ.

(*ඇ*) ඊට පසු එක් එක් වතාව සඳහා රු. 250.00 බැගින් අය කරනු ලැබේ.

15. මෙම විභාග ගාස්තුව විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂය 20-03-02-13ට බැරවෙන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම තැපැල් කාර්යාලයකට ගෙවා ලබා ගන්නා ලදුපත අයදුම් පතේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ අලවා එවිය යුතු ය. ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. විභාග ගාස්තුව සඳහා මුදල් ඇණවුම් හෝ මුද්දර භාර ගනු නොලැබේ.

16. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවයක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

17. මෙම නිවේදනය මගින් ආවරණය නොවන කිසියම් කාරණයක් වෙතොත් ඒ පිළිබඳව තීරණය කිරීමේ අයිතිය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා සතු ය.

මහාචාර්ය කේ. කපිල සී. කේ. පෙරේරා,
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

2020 සැප්තැම්බර් මස 21 වැනි දින,
පැලවත්ත, ඉසුරුපාය, අධ්‍යාපන අමාත්‍යාංශයේ දී ය.

**ආදර්ශ අයදුම්පත**

***ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය III ශ්‍රේණියට අදාළ සන්ධාන භාෂා (ඉංග්‍රීසි) විභාගය - 2020***

Link Language (English) Examination for Sri Lanka Euducation Administrrative Service - 2020

1. (i) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.
(*උදා* : HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)
(ii) අගට යෙදෙන නම මුලින් ද අනෙකුත් නම්වල මුලකුරු පසුව ද යොදා නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.
(උදා : GUNAWARDHANA, H. M. S. K.)
(iii) සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

2. (i) ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ ශ්‍රේණිය :———.
(ii) වර්තමාන සේවා ස්ථානය :———.

3. ලිපිනය :
(i) පෞද්ගලික :————.
(ii) රාජකාරි :————.
(iii) ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්)
(iv) රාජකාරි දුරකථන අංකය :

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|

(v) ජංගම දුරකථන අංකය :

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|

4. (i) ජාතික හැඳුනුම්පත් අංකය :

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|

(ii) උපන් දිනය :

වර්ෂය [ ][ ][ ][ ] මාසය [ ][ ] දිනය [ ][ ]

(iii) ස්ත්‍රී/පුරුෂ භාවය : පුරුෂ - 0 [ ]
ස්ත්‍රී - 1

(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

5. විභාග ගාස්තු ගෙවා ලබාගත් ලදුපතේ විස්තර :

ලදුපත් අංකය :————.
තැපැල් කාර්යාලය :————.
දිනය :————.

ලදුපත මෙහි අලවන්න.

6. ඉහත සඳහන් තොරතුරු නිවැරදි බව ප්‍රකාශ කරමි. තව ද, විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත්වන බව ද ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

7. විභාග කොමසාරිස් ජනරාල්,

මෙම විස්තරය දක්වෙන අපේක්ෂකයා/අපේක්ෂිකාව මාගේ ආයතනයේ සේවය කරන බව ද/*ඔහු/ඇය විභාග ගාස්තුවෙන් නිදහස් බව ද/මුදල් ගෙවූ ලදුපත ඉහත අලවා ඇති බව ද ප්‍රකාශ කරමි. (*)

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන,
පදවි නාමය සහ නිල මුද්‍රාව.

දිනය :————.
(*) ගාස්තු ගෙවීමට අවශ්‍ය නොවේ නම් කපා හරින්න.

01-01

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
# දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන
# සංශෝධිත ගාස්තු

2013 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළෙඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යැයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 | 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 | 0 |
| තනි තීරුවකට හෝ *ගැසට්* පිටුවකින් අඩකට ... ... ... | 1,300 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ *ගැසට්* පිටුවකට ... ... ... | 2,600 | 0 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* | *තැපැල් ගාස්තුව* |
|---|---|---|
| | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 0 | 9,340 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 0 | 950 0 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු හා පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 0 | 750 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 0 | 2,500 0 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... ... | 860 0 | 450 0 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... ... | 260 0 | 275 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 0 | 4,360 0 |
| V වැනි කොටස (මගීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 0 | 3,640 0 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 0 | 1,250 0 |
| අති විශෙෂ ගැසට් පත්‍රය ... ... ... ... ... ... ...... | 5,145 0 | 5,520 0 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

## * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | පිටපතක මිල | තැපැල් ගාස්තුව |
|---|---|---|
| I වැනි කොටස : | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 0 | 60 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 0 | 60 0 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 0 | 60 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 0 | 120 0 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 0 | 60 0 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 0 | 60 0 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 0 | 60 0 |

* කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනි පිටපත් මිල දී ගත හැක.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

**සැළකිය යුතුයි.** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

**2021 වර්ෂය**

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| ජනවාරි | 2021.01.01 | සිකුරාදා | 2020.12.18 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.01.08 | සිකුරාදා | 2020.12.24 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2021.01.15 | සිකුරාදා | 2021.01.01 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.01.22 | සිකුරාදා | 2021.01.08 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.01.29 | සිකුරාදා | 2021.01.15 | සිකුරාදා | දහවල් | 12.00 |
| පෙබරවාරි | 2021.02.05 | සිකුරාදා | 2021.01.22 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.02.12 | සිකුරාදා | 2021.01.29 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.02.19 | සිකුරාදා | 2021.02.05 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.02.25 | බ්‍රහස්පතින්දා | 2021.02.12 | සිකුරාදා | දහවල් | 12.00 |
| මාර්තු | 2021.03.05 | සිකුරාදා | 2021.02.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.03.12 | සිකුරාදා | 2021.02.25 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2021.03.19 | සිකුරාදා | 2020.03.05 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.03.26 | සිකුරාදා | 2020.03.12 | සිකුරාදා | දහවල් | 12.00 |

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2020 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.